**SAMODHANA JOURNAL**
Faculty of Social Sciences and Humanities,
Rajarata University of Sri Lanka,
Mihintale

2024 Volume 13 Issue II

# සමකාලීන සමාජ සන්දර්භ තුළ ව්‍යසනයක්ව පවතින ආලයෙහි ප්‍රචණ්ඩත්වය (Dating Violence) පිළිබඳව විමර්ශනාත්මක අධ්‍යයනයක්.

කේ. සී. සී. තිලකරත්න[1]

Received Date: 18th August 2024
Accepted Date: 08th May 2025
Published Date: 02nd February 2026

**Abstract**

Love is a complex phenomenon encompassing a wide range of feelings, behaviors, and experiences. It is often described as a deep relationship between individuals. Violence is a condition that operates through patterns of influential behavior rooted in hostile thoughts toward a person, leading to mental or physical harm. This violence extends to various aspects, and its impact is also felt within love. Accordingly, violence arises in love. Violence in love is a pattern of abusive and coercive behavior used to maintain power and control over a current or former intimate partner. It was identified that this can occur in any relationship, regardless of age, gender, sexual orientation, or socioeconomic status. The research problem of this study was "What is the nature of violence in love?" This study used a library survey methodology to collect qualitative data. The objective of the study was to critically examine the forms of violence in love existing within various social contexts. Furthermore, identifying instances of victims of violence in love, directing social attention toward those conditions, and attempting to plan necessary steps to liberate or rescue them from painful situations is the research significance of this study. It was observed that violence in love operates in various forms. Under these conditions, such as abusive behavior, emotional

[1] ඉතිහාස හා පුරාවිද්‍යා අධ්‍යයනාංශය, රුහුණ විශ්වවිද්‍යාලය. chandunichethana@gmail.com

violence, harassment, financial control, sexual violence, physical violence, isolation, and intimidation, could be identified. Within Sri Lankan society, it can be seen that the lives of young men and women are being prematurely destroyed due to violence in love, and this condition has influenced the creation of serious social problems. It could be identified that this violence in love has created problematic situations not only within Sri Lanka but also globally. In this study, the analysis focuses on how violence in love has become a social epidemic in contemporary societies.

Key words: Contemporary, Epidemic, Love, Social issues, Violence

**සාරාංශය**

ආදරය වූ කලී පුළුල් පරාසයක හැඟීම්, හැසිරීම් සහ අත්දැකීම් ඇතුළත් සංකීර්ණ චිත්තවේගයකි. එය බොහෝ විට පුද්ගලයන් අතර ගැඹුරු සම්බන්ධතාවයක් විස්තර කරනු ලැබේ.ප්‍රචණ්ඩත්වය වූ කලී කිසියම් පුද්ගලයෙකු කෙරෙහි ද්වේශ සහගත සිතුවිලි මූලික කරගෙන බලපෑම් සහගත හැසිරීම් රටාවක නිරත වීම,මානසික හෝ කායික හානි සිදු කිරීම දක්වා ක්‍රියාත්මක වන තත්ත්වයකි.මෙම ප්‍රචණ්ඩත්වය විවිධ අංශ කෙරෙහි විහිදී යන අතර ආලය කෙරෙහිද එය බලපෑම් සිදු කරනු ලැබේ.එ අනුව ආලයේ ප්‍රචණ්ඩත්වය නිර්මාණය වීම සිදු වනු ලැබේ.ආලයෙහි ප්‍රචණ්ඩත්වය යනු වත්මන් හෝ හිටපු සමීප සහකරුවෙකු කෙරෙහි බලය පවත්වා ගැනීමට සහ පාලනය කිරීමට භාවිතා කරන අපවාදාත්මක සහ බලහත්කාර හැසිරීම් රටාවකි. වයස, ස්ත්‍රී පුරුෂ භාවය, ලිංගික දිශානතිය හෝ සමාජ ආර්ථික තත්ත්වය නොසලකා ඕනෑම සම්බන්ධතාවයකදී එය සිදුවිය හැකි බව හදුනා ගත හකි විය.මෙම අධ්‍යයනයේ අධ්‍යයන ගැටලුව වූයේ ආලයෙහි ප්‍රචණ්ඩත්වයේ ස්වභාවය කෙසේද? යන්න පිළිබඳවයි.මෙම අධ්‍යයනය පුස්තකාල සමීක්ෂණ ක්‍රමවේදය ඔස්සේ  ගුණාත්මකදත්ත පදනම් කර ගනිමින් සිදු කරන ලදි.අධ්‍යයන අරමුණ වූයේ විවිධ සමාජ සන්දර්භ තුළ පවතින ආලයේ ප්‍රචණ්ඩත්වයේ ස්වරූප  පිළිබඳව විමර්ෂණාත්මකව අධ්‍යයනය කිරීම වේ .එමෙන්ම ආලයෙහි ප්‍රචන්ඩත්වයට ගොදුරුවන අවස්ථා හඳුනා ගනිමින් එම තත්ත්ව පිළිබඳව සමාජයේ අවධානය යොමු කරවමින් පීඩාකාරී අවස්ථාවලින් ස්වයංව මිදීමට හෝ මුදවා ගැනීමට අවශ්‍ය පියවර ගැනීමට කටයුතු සැලසීමට උත්සාහ දැරීම මෙම අධ්‍යයනයේ අධ්‍යයන වැදගත්කමකි.ආලයේ ප්‍රචණ්ඩත්වය විවිධ ස්වරූපවලින් ක්‍රියාත්මක වීම දකිය හැකි විය.ඒ යටතේ අපවාදාත්මක හැසිරීම්,චිත්තවේගීය ප්‍රචණ්ඩත්වය,හිරිහැර කිරීම,ආර්ථික පාලනය,ලිංගික හිංසනය,ශාරීරික හිංසනය,හුදෙකලා කිරීම,බිය ගැන්වීම වැනි තත්ව හදුනා ගැනීමට හැකි විය.ලාංකීය සමාජය තුළ ආලයේ ප්‍රචණ්ඩත්වය හේතුවෙන් තරුණ තරුණියන්ගේ ජීවිත අකාලයේ විනාශ වී යාම දැකිය හැකි වූ අතර මෙම තත්වය බරපතල සමාජ ගැටලු නිර්මාණය කිරීම කෙරෙහි බල පා ඇත.මෙම ආලයෙහි ප්‍රචණ්ඩත්වය ලංකාව තුල පමණක් නොව ගෝලීය වශයෙන් ගැටලුකාරී තත්ව උද්ගත කර දී ඇති බව

හඳුනා ගත හැකි විය. මෙම අධ්‍යයනයේ දී ආලයෙහි ප්‍රචණ්ඩත්වය සමකාලීන සමාජ තුල සමාජ ව්‍යසනයක් වන අන්දම පිළිබඳව විග්‍රහ කර ඇත.

**මුඛ්‍ය පදඃ** ආලය, ප්‍රචණ්ඩත්වය, ව්‍යසනයක්, සමකාලීන, සමාජ ගැටලු

## හැඳින්වීම

මනුෂ්‍ය වර්ගයාගේ ආරම්භයේ සිටම ජීවය පවත්වාගෙන යෑම සඳහා විවිධාකරයේ වූ සබඳතාවයන් ගොඩ නගා ගැනීම මානව ශිෂ්ටාචාරය පුරාවටම දැක ගත හැකිය.එහි ප්‍රධාන සංකල්පයක් වශයෙන් ස්ත්‍රීන් හා පුරුෂයන් අතර තම වර්ගයාගේ පැවැත්ම සඳහා ඇති කර ගන්නා ලද සමීප සබඳතා පෙන්වා දිය හැකිය.එම සමීප සබඳතාවයන්හි පැවැත්ම වර්ධනය කර ගැනීම සඳහා දෙදෙනා අතර ඇතිවන අන්‍යෝන්‍ය හැඟීම් සහා අවබෝධය මත පදනම් වූ සංකල්පයක් වශයෙන් ආදරය දැක්විය හැක.(රණසිංහ,2023ඃ189).අධිකතර ආදරය නම් සොබාදහමේ ජීව විද්‍යාත්මක උපායකි.ගැහැණියක් එමගින් මිනිසෙකු හා එක් කොට සහෙන්න කලක් ප්‍රජනනය සඳහා තැබීම සහතික කරයි.(චන්ද්‍රවංශ,2008ඃ268).මීට අමතරව ස්ත්‍රී පුරුෂ සමාජභාවය සැලකීමේදී විරුද්ධ ලිංගිකයන් අතර මෙන්ම සමරිසි ප්‍රාජාව අතරද මෙම ආදරය නැමැති සංකල්පය ඇති බව දැකිය හැකි වේ.ආදරය යනු සමාජයීය වශයෙන් මානව අවශ්‍යතාවයකි.ආලය සහ ප්‍රචණ්ඩත්වය යන වචන දෙකෙහි තේරුම සම්පූර්ණයෙන්ම එකිනෙකට වෙනස් මානසික තත්ව දෙකක් වේ. පුද්ගලයෙකුට තවත් පුද්ගලයෙකු කෙරෙහි ඇතිවන ආදරය; ආශාව, අයිතිකර ගැනීම, හැඟීම් සහගත සහකම්පනය වැනි මානසික තත්ත්වයන් ගේ මෘදු ස්වභාවය ආලය යන වචනයෙන් නිරූපිත වේ. නමුත් ප්‍රචණ්ඩත්වය ඊට වඩා සම්පූර්ණයෙන්ම වෙනස් මානසික තත්ත්වයකි.වචනාර්ථය අනුවම තවත් අයෙකු කෙරෙහි ද්වේශ සහගත සිතුවිලි මූලික කරගෙන සිදුවන බලපෑම් සහගත හැසිරීම් රටාවක් ඇති වීම මානසික හෝ කායික හානි සිදු කිරීම දක්වා ක්‍රියාත්මක වන තත්ත්වයකි.මෙම එකිනෙකට වෙනස් මානසික තත්වයන් ආදර සබඳතා තුළ දැකිය හැක.ඒ අනුව ආලය මූලික කොටගෙන පුද්ගලයන් තුල ඇතිවන ප්‍රචණ්ඩ හැසිරීම් ආලයෙහි ප්‍රචණ්ඩත්වය (dating violence) ලෙස හැඳින් විය හැක.මෙම අධ්‍යයනය මගින් ආලයෙහි ප්‍රචණ්ඩත්වය පිළිබඳව පැහැදිලි කිරීම් පරීක්ෂා කරනු ලැබේ.ප්‍රචණ්ඩත්වය පිළිබඳව පර්යේෂණ සිදුවී ඇති නමුදු ආලයෙහි ප්‍රචණ්ඩත්වය පිළිබඳව සාහිත්‍ය පරීක්ෂා කිරීමේදී පැහැදිලි වනුයේ මේ පිළිබඳව පර්යේෂණවල හිඩැසක් ඇති බවයි.ආලයෙහි ප්‍රචණ්ඩත්වය බොහෝ දුරටත් සමීප පුද්ගලයන් අතරින් සිදුවන බැවින් මේ පිළිබඳව අධ්‍යයනය කිරීම සඳහා පුළුල් සමාජ විද්‍යා ප්‍රවේශයක් නොමැතිකම මෙම ක්ෂේත්‍රයේ පර්යේෂණ අවම වීමට බලපා ඇති බව සිතිය හැක.ආදරය කිරීමේ දී බලාපොරොත්තු වන මානසික නිදහස වෙනුවට ආලයෙහි ප්‍රචණ්ඩත්වයෙන් පීඩිත තත්ත්වයකට පත්වීමේ සිදුවීම් ඉහල යාම වර්තමාන සමාජයේ බරපතළ ගැටලුවක් ලෙස හඳුනාගත හැකිය.ආලය තුළින් මානසික හා කායික සැනසීමක් බලාපොරොත්තු වන පුද්ගලයකුට ඒ වෙනුවට ප්‍රචණ්ඩත්වයට ගොදුරු වීමෙන් මානසික අසහනයට පත් වීම සිදුවේ. ප්‍රචණ්ඩත්වයේ උච්ච ස්වභාවය තුලින් මානසික, ශාරීරික හිංසනවල සිට මරණය දක්වා අත්දැකීම් වලට පුද්ගලයන්ට මුහුණ දීමට සිදු වීම දැකිය හැකි වේ.සමකාලීන ශ්‍රී ලංකාව තුළ

ආලයේ ප්‍රචණ්ඩත්වය හේතුවෙන් සියළුම වයස් පරාසවල ජීවත් වන පුද්ගලයන්ට මෙය දැඩිව බලපාන බව සංඛ්‍යාත්මකව පැහැදිලි වේ.මෙය වර්තමාන සමාජ සන්දර්භය තුළ ගෝලීය වශයෙන් වර්ධනය වෙමින් පවතින බරපතල ඛේදවාචකයක් බවට පත්ව ඇත.එම නිසා මෙම අධ්‍යයනයේ දී ආලයෙහි ප්‍රචණ්ඩත්වය සමකාලීන සමාජ ව්‍යසනයක් බවට පත්ව ඇති අන්දම විමර්ශනාත්මකව විග්‍රහ කර ඇත.

## අධ්‍යයන ගැටලුව

( ආලයේ ප්‍රචණ්ඩත්වය වර්තමාන සාමාජය තුළ සාමාන්‍ය සිදුවීමක් බවට පත්වෙමින් තිබීම ඛේදජනක තත්ත්වයකි. ආලයේ ප්‍රචණ්ඩත්වය තුළින් කායිකව හා මානසිකව පීඩනයට ගොදුරුවන පුද්ගලයන් තුලින් සමාජ ගැටලු නිර්මාණය වීම සිදුවේ. දීර්ඝ කාලීනව ආලයේ ප්‍රචණ්ඩත්වයට ලක්වන ස්ත්‍රී හා පුරුෂ පාර්ශව කායික,මානසික හා සමාජීය වශයෙන් පහළ මට්ටමකට ඇද වැටීම හමුවේ ඔවුන්ගේ එදිනෙදා ජීවිතය කෙරෙහි එම තත්වය අහිතකර අන්දමින් බලපා ඇති බව හඳුනාගත හැකිය. ඒ අනුව මෙම අධ්‍යයනයේ අධ්‍යයන ගැටලුව වූයේ ආලයෙහි ප්‍රචණ්ඩත්වයේ ස්වභාවය කෙසේද?යන්න පිළිබඳවයි. මෙම අධ්‍යයනයේදි හදුනා ගන්නා ලද කරුණු පහත අධ්‍යයන ප්‍රශ්න තුලින් හදුනා ගැනීම සිදු කරන ලදි.

1. ආලයෙහි ප්‍රචණ්ඩත්වය යනුවෙන් අදහස් කරන්නේ කුමක්ද?
2. ආලයෙහි ප්‍රචණ්ඩත්වය සඳහා වී ඇති හේතු සාධක මොනවාද?
3. ස්ත්‍රී පුරුෂ සමාජ භාවය ආලයේ ප්‍රචණ්ඩත්වය සඳහා බල පා ඇත්තේ කෙසේද?
4. ගෝලීය වශයෙන් ආලයෙහි ප්‍රචණ්ඩත්වයේ ස්වභාවය කෙසේද?
5. ලාංකීය වශයෙන් ආලයෙහි ප්‍රචණ්ඩත්වයේ ස්වභාවය කෙසේද?
6. ආලයේ ප්‍රචණ්ඩත්වය පිටුදැකීම සඳහා පිරිස් සවි බල ගැන්විමට වර්තමානයේ භාවිතයට ගනු ලබන ක්‍රම මොනවාද?

ඒ අනුව වර්තමාන සමාජයේ ප්‍රබල සමාජ ගැටලුවක් බවට ආලයේ ප්‍රචණ්ඩත්වය පත්ව ඇති බව හදුනා ගත හැකි ය.ඉතා කුඩා බහින් බස් වීමක සිට ඝාතනය කිරීම් ඝාතනයට තැත් කිරීම් දක්වා ඛේදජනක ඉරනම් අත් කර දීමට ආලයේ ප්‍රචණ්ඩත්වය බලපෑම් සිදු කර ඇති බව හදුනා ගතහැකි විය.

## පර්යේෂණ ක්‍රමවේදය

මෙම අධ්‍යයනය පුස්තකාල සමීක්ෂණ ක්‍රමවේදය භාවිත කරමින් සිදු කරන ලදී.විශේෂයෙන් මෙම පර්යේෂණය සඳහා අදාළ විෂය ක්ෂේත්‍රයේ ප්‍රකාශිත විවිධ පර්යේෂණ පත්‍රිකා,ග්‍රන්ථ අධ්‍යයනය කිරීම සිදු කරන ලදි.එහිදී හඳුනා ගනු ලැබූ තොරතුරු අනුව ප්‍රචණ්ඩත්වය සහ එහි ස්වරූපයන්,සමාජ සන්දර්භ තුල මිනිසුන් ප්‍රචණ්ඩත්වයට නතුවන ආකාරය සහ ප්‍රචණ්ඩත්වය ක්‍රියාවට නැංවීම,සමාජයට මෙමගින් සිදුවන බලපෑමක් යනාදී බොහෝ ක්ෂේත්‍ර පිළිබඳව අනාවරණය කර

ගැනීමට හැකියාව ලැබිණි. පර්යේෂණ පත්‍රිකාවලින් ලබාගත් තොරතුරු විශ්ලේෂණය කිරීමෙන් පසු, මෙම පර්යේෂණ මාතෘකාව සම්බන්ධයෙන් පුනරාවර්තනය වන පොදු තේමා සහ විවිධ මතවාද හඳුනාගත හැකි විය. එසේම, පවතින පර්යේෂණවල සීමාවන් සහ තවදුරටත් ගවේෂණය කළ යුතු ක්ෂේත්‍ර ද මෙහිදී හඳුනා ගන්නා ලදී.මෙම සාහිත්‍ය මූලාශ්‍රවල අඩංගු තොරතුරු ගුණාත්මක දත්ත ලෙස යොදාගෙන ඒවා අන්තර්ගත විශ්ලේෂණ ක්‍රමය ඔස්සේ විග්‍රහ කිරීම මෙම අධ්‍යයනයේදී සිදුවිය.සමාජීය විද්‍යා පර්යේෂණ වලදී භාවිත කරනු ලබන විද්‍යාත්මක ක්‍රමවේදය ඔස්සේඑකතු කරන ලද දත්ත සම වර්ගීය ලෙස වෙන් කොට විග්‍රහ කිරීමෙන් පසුව ඒවා නිරීක්ෂණයකොට පිළිවෙලකට ඉදිරිපත් කිරීමත් මෙහිදී සිදුවිය.

## අධ්‍යයන අරමුණු හා වැදගත්කම

මෙම අධ්‍යයනය මගින් මුදුන් පමුණුවා ගැනීමට අපේක්ෂා කරන ලද ප්‍රධාන අරමුණ වූයේ සමාජ සන්දර්භය තුළ පවතින ආලයේ ප්‍රචණ්ඩත්වයේ ස්වරූප පිළිබඳව විමර්ෂණාත්මකව අධ්‍යයනය කිරීමයි. මීට අමතරව මෙම අධ්‍යයනය මගින් අපේක්ෂිත සෙසු අරමුණු කිහිපයක් විය. එනම්,

1. ආලයෙහි ප්‍රචණ්ඩත්වය යනු සුළුවෙන් සැලකිය යුතු කරුණක් නොවන බවත් ඒ සඳහා එරෙහි විය යුතු බවට සමාජය තුළ කතිකාවතක් ඇති කිරීම

2. ආලයෙහි ප්‍රචණ්ඩත්වයට ගොදුරු වන්නන්ගේ කායික හා මානසික යහපැවැත්ම කෙරෙහි අවධානය යොමු කිරීම.

එම සෙසු අරමුණු විය.එමෙන්ම ආලයෙහි ප්‍රචන්ඩත්වයේ විකාශනයන්,නව මුහුණුවරයන් හඳුනා ගනිමින් වර්තමානයේ ආලයේ ප්‍රචණ්ඩත්වයට ගොදුරු වූ පුද්ගලයන් හා ගොදුරු විය හැකි පුද්ගලයන් ඉන් මුදවා ගැනීමට ගෙන ඇති පියවර හා අවස්ථා හඳුනා ගනිමින් එම තත්ත්ව පිළිබඳව සමාජයේ අවධානය යොමු කරවමින් පීඩාකාරී අවස්ථාවලින් ස්වයංව මිදීමට හෝ මුදවා ගැනීමට අවශ්‍ය පියවර ගැනීමට කටයුතු සැලසීමට උත්සාහ දැරීම මෙම අධ්‍යයනයේ අධ්‍යයන වැදගත්කමකි.

## විමර්ශනය

### ප්‍රචණ්ඩත්වය අර්ථ දැක්වීම

ප්‍රචණ්ඩත්වය වූ කලී මානව ඉතිහාසය පුරාවටම විවිධ ස්වරූපවලින් පැවත එන සංකීර්ණ සමාජ ගැටලුවකි.ප්‍රචණ්ඩත්වය හුදෙක් ශාරීරික පහර දීම්වලට පමණක් සීමා නොවන අතර වාචික අපයෝජනයන්, නොසලකා හැරීම්, ආර්ථික පීඩනයන් සහ ව්‍යුහාත්මක අසාධාරණයන් වැනි පුළුල් පරාසයක ක්‍රියාවන් අනාවරණය කරනු ලබයි. කිසියම් පුද්ගලයෙකු ප්‍රචණ්ඩකාරී ලෙස හැසිරීම සඳහා විවිධාකාර හේතු බලපාන බව පර්යේෂණවලින් හඳුනාගෙන තිබේ.මනෝවිද්‍යාත්මක පර්යේෂණ මගින් අවධාරණය කරනු ලබන්නේ ආක්‍රමණශීලී චර්යාවන්, සමාජ විරෝධී පෞරුෂ ආබාධ වැනි මානසික ආබාධ තත්ත්වයන්,මත්ද්‍රව්‍ය භාවිතය සහ ආතතිය වැනි පෞද්ගලික සාධක පුද්ගලයකු තුළ ප්‍රචණ්ඩත්වය ඇතිවීම සඳහා බලපෑම් සිදුකළ හැකි බවයි

(Bandura,1977:45). තවද පුද්ගලයෙකුගේ ප්‍රචණ්ඩකාරී නැඹුරුව වැඩි වීම සඳහා කාලයේ තමන් විඳි අත්දැකීම් සහ ප්‍රචණ්ඩත්වයට නිරාවරණය වීමත් දුර්වල ආවේග පාලනය කිරීමට නොහැකි වීමත් යන හේතු බලපෑ හැකි බවහඳුනාගෙන තිබේ (Smith & Jones,2005:102-105). ප්‍රචණ්ඩත්වය පුළුල් සමාජ ව්‍යුහයන් සහ ක්‍රියාවලීන්ගේ ප්‍රතිඵලයක් වශයෙන් සමාජ විද්‍යාත්මක පර්යේෂණ තුළින් හඳුනාගනු ලබයි.එනම් දරිද්‍රතාවය, සමාජ අසමානතාවය,අධ්‍යාපන අවස්ථා නොමැතිකම සහ ප්‍රචණ්ඩත්වය සාමාන්‍යකරණය කරන සංස්කෘතික සම්මතීන් ප්‍රචණ්ඩත්වය වර්ධනය කිරීමට දායක විය හැකි බවයි (Merton,1938:678). Gender based violence හෙවත් ලිංග භේදයන් පදනම්කරගත් ප්‍රචණ්ඩත්වයන් සමාජයේ පවතින ස්ත්‍රී පුරුෂ භූමිකාවන්හි බල අසමතුලිතතාවයේ ප්‍රථිඵලයක් බව පර්යේෂකයන් විසින් හඳුනාගෙන ඇත (Concell,2009:156). ප්‍රචණ්ඩත්වය වූ කලී කුරිරු අත්දැකීමකි. ඕනෑම සමාජ සන්දර්භයක් තුළ දේශපාලනික, ආර්ථික, සමාජීය ආදී විවිධ ස්වරූපවලින් යුක්තව ප්‍රචණ්ඩත්වය ක්‍රියාවට නැංවෙන අයුරු දැකිය හැකිවේ. ඇමෙරිකන් ජාතික මනෝවිද්‍යාඥවරයකු වන ඒබ්‍රහම් මාස්ලෝ පෙන්වා දෙන පරිදි ප්‍රචණ්ඩත්වය ඇති වීම සඳහා මූලික වශයෙන් ම බලපානු ලබන්නේ පුද්ගලයා සතු අවශ්‍යතා ඉටු කර ගැනීමට නොහැකි වීමයි. එබැවින් පුද්ගලයා අසහනකාරී මානසිකත්වයකට පත්වන අතර ඒ ඔස්සේ ප්‍රචණ්ඩත්වය ගොඩනැගීම සිදුවන බව මාස්ලෝ පෙන්වා දෙනු ලබයි (බාලසූරිය,1999:13).

ප්‍රචණ්ඩත්වයේ ප්‍රතිවිපාක පුද්ගලයින්ට පවුල් වලට සහ සමස්ත සමාජයටම දැඩි බලපෑම් ඇති කරනු ලබන අතර එමගින් ශාරීරික හා මානසික තුවාල මරණය බිය අනාරක්ෂිත භාවය වැනි ක්ෂණික ප්‍රති විපාක මෙන්ම දිගුකාලීන මානසික සෞඛ්‍ය ගැටලු සම්මාජ සබඳතා බිඳ වැටීම් ආර්ථික දුෂ්කරතා යනාදීඅහිතකර ප්‍රතිඵලය ඇතිවිය හැකිවේ (Finkelhor et al.,2007:87-90).

ප්‍රචණ්ඩත්වය බහුමාන ස්වභාවයක් ගනු ලබන බව හඳුනාගත හැකිය.එනම් ආගමික ප්‍රචණ්ඩත්වය,ආයතන ගත ප්‍රචණ්ඩත්වය, සංස්කෘතික ප්‍රචණ්ඩත්වය,පවුලේ ප්‍රචණ්ඩත්වය,ස්වාත්ම ප්‍රචණ්ඩත්වය, කණ්ඩායම්වාදී ප්‍රචණ්ඩත්වය, ලිංගික ප්‍රචණ්ඩත්වය,ධනකාමී ප්‍රචණ්ඩත්වය, ස්වභාවධර්මයට එරෙහි ප්‍රචණ්ඩත්වය හා බලකාමී ප්‍රචණ්ඩත්වය වශයෙන් ප්‍රචණ්ඩත්වය හා සම්බන්ධ වර්ගීකරණයන් දැකිය හැකි වේ. (එදිරිසිංහ,2007:13). මේවා මගින් එකිනෙකට වෙනස් හේතු සහ ප්‍රතිවිපාක ඇතිවිය හැකි බැවින් වාට ප්‍රතිචාර දැක්වීම සඳහා විවිධ උපායමාර්ග අවශ්‍ය වේ මෙම අධ්‍යයනය මගින් අවධානය යොමු කරනු ලබන්නේ ප්‍රචණ්ඩත්වයේ තවත් එක් ස්වරූපයක් වන ආලයේ ප්‍රචණ්ඩත්වය කෙරෙහිය.

**ආලයේ ප්‍රචණ්ඩත්වය**


ආලය මූලික කරගෙන ඇතිවන ප්‍රචණ්ඩත්වය යනු සබඳතාවයක සිටින එක් පුද්ගලයෙකු විසින් තවත් පුද්ගලයෙකු කෙරෙහි බලය ලබා ගැනීමට සහ පාලනය කිරීමට යොදා ගන්නා බලහත්කාර සහ අපවාදාත්මක උපක්‍රමවල රටාවකි.එය ශාරීරික හිංසනය, බලහත්කාරය, තර්ජන, බිය ගැන්වීම්, හුදකලා කිරීම සහ චිත්තවේගීය, ලිංගික හෝ ආර්ථික අපයෝජන ඇතුළු බොහෝ ආකාර ගත හැකිය

(Violence in dating relationships,2006:1).සමාජ ප්‍රශ්නයක් ලෙස සැලකිය හැකි ආලයෙහි ප්‍රචණ්ඩත්වය හඳුනා ගැනීමේදී මූලික වශයෙන් මෙම සංකල්ප දෙක අර්ථකථනය කර ගැනීම වැදගත් වේ. මේ අනුව සලකා බැලීමේදි ආදරය පිළිබඳව විවිධ නිර්වචන ඉදිරිපත් වී ඇත.ඉන් අදහස් කිහිපයක් පහත දැක්වේ.

- පෞද්ගලික බෙදීම් මත තවත් කෙනෙකු කෙරෙහි ඇතිවන දැඩි මානසික බැඳීමකි.
- ලිංගික ආශාව මත පදනම් වූ ආකර්ෂණයකි
- පෙම්වතුන්ට දැනෙන මෘදු හැඟීම්
- ප්‍රශංසාව, කරුණාව හෝ පොදු අවශ්‍යතා මත පදනම් වූ මානසික තත්ත්වයකි
- උණුසුම් හැඟීම්, උද්යෝගය හෝ භක්තිය වැනි මානසික හැඟීම් (රණසිංහ,2023:178-200 ඇසුරිනි)

ආලයෙහි ඇති එක් වැදගත්කමක් වන්නේ එහි ඇති මානසික මානය වේ. එහිදී ආදරයට සීමා නොමැති අතර ආදරය අසීමිතව දැනෙන මානසික තත්ත්වයකි. නමුත් පෙම්වතුන් ආදරයේදී පරාර්ථකාමී වනවාට වඩා ආත්මාර්ථකාමීව සිතීම දැකිය හැකිය. සෑම දෙනෙක්ම ආදරය වැළඳ ගැනීමට කැමැති වුවද තම පෙම්වතා හෝ පෙම්වතිය ගේ ආදරය තමන්ට පමණක් හිමිවිය යුතුයි යන මානසික තත්ත්වයට පත්වීම සිදුවේ. ඒ අනුව ආදරය වෙනත් අයෙකුට අයිති වනු ඇතැයි යන හැඟීම මත අනෙකාගෙ නිදහස සීමා කිරීම බොහෝ ආදර සබඳතා වල දැකිය හැකිය. මෙම සීමා කිරීමට එරෙහි වීම සමඟ ඇතිවන ගැටුම්වලින් ආලයෙහි ප්‍රචණ්ඩත්වය ආරම්භ වේ. ආලයෙහි ප්‍රචණ්ඩත්වය හඳුනා ගැනීමේදී ද ඒ පිළිබඳව ඇති අර්ථකථන හඳුනා ගැනීම වැදගත් වේ. වැඩිපුර ආදරේ කිරීම හෙවත් සීමා මායිම් නොමැතිව ආදරය කිරීම තවත් අයෙකුට හානියක් විය හැකිය. අධික ආදරය හෙවත් සීමාවක් නොමැති හිංසාකාරී ආදරය සමාජයේ දැකිය හැකිය. අධික ආදරයත් ඇතැම් අවස්ථාවලදී සහකරුට හෝ සහකාරියට පීඩාකාරි විය හැකිය. එබැවින් ආදරය කරන අය අතර ගැටුම් ඇති වී ප්‍රචණ්ඩත්වයට පත් වී තම ආදර සහකරුට හෝ සහකාරියට ප්‍රචණ්ඩ ලෙස හැසිරීම සමාජ ප්‍රශ්නයක් බවට ද පත්වේ.

ආදර සබඳතාවයක් විශේෂ පැති තුනක් සමඟ අන්තර් ක්‍රියා කරනු ලබයි. එනම් සත්‍යවාදි බව, වගකීම හා සන්නිවේදනය යන ආකල්ප මත වේ. ඒ පිළිබඳව පහත රූප සටහන මගින් හඳුනා ගත හැකි වෙ.




*රූපසටහන 5.1. ආදර සබදතාවයක ප්‍රතිමාන අන්තර් ක්‍රියා කරන අයුරු. (රණසිංහ,2023:20).*

මෙම ආකල්ප ත්‍රිත්වය යහපත් මට්ටමකට පවත්වා ගැනීමට හැකියාව නොලැබෙන්නේ නම් යහපත් ආදර සබදතාවයක් පවත්වා ගැනීමට හැකියාවක් ලැබීම අපහසු වේ.

ඇමරිකානු අධිකරණ දෙපාර්තමේන්තුව වෙබ් අඩවියේ සඳහන් වන පරිදි ආලයෙහි ප්‍රචණ්ඩත්වය යනුවෙන් අදහස් කරන්නේ වින්දිතයා සමඟ ප්‍රේමණීය හෝ සමීප ස්වභාවයක සමාජ සබඳතාවයක යෙදී සිටින හෝ සම්බන්ධතාවයක් ඇති පුද්ගලයෙකු විසින් කරනු ලබන ප්‍රචණ්ඩත්වයකි (United States department of justice).

කාන්තාවන්ට එරෙහි හිංසනය වැළැක්වීම සහ ඒවාට එරෙහිව සටන් කිරීමේ සම්මුතිය තුල ආලයෙහි ප්‍රචණ්ඩත්වය අර්ථ දක්වා ඇත්තේ පහත පරිදිය.

"ආලයෙහි ප්‍රචණ්ඩත්වය යනු පුද්ගලයන් දෙදෙනකු අතර සමීප සහකරුගේ ප්‍රචණ්ඩත්වයකි. එය ශාරීරික චිත්තවේගීය හෝ ලිංගික ප්‍රචණ්ඩත්වයක් වේ". (convention of preventing and combating violence against women, 2012:51).

මීට අමතරව ඇමරිකානු නීති දෙපාර්තමේන්තුවේ කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය පිටුදැකීමේ කාර්යාලය ආලයෙහි ප්‍රචණ්ඩත්වය අර්ථ දක්වා ඇත්තේ උක්ත පරිදිය.

ආලයෙහි ප්‍රචණ්ඩත්වය යනු "සම්බන්ධතාවයක යෙදී සිටින එක් පුද්ගලයෙකු විසින් අනිත් පුද්ගලයා කෙරෙහි බලය ලබා ගැනීමට හා පාලනය කිරීමට යොදා ගන්නා බලහත්කාරී අපවාදාත්මක උපක්‍රමවල රටාවකි." ( United States Office on violence against women)

ආලෙහි ප්‍රචණ්ඩත්වය පිළිබඳව වොෂින්ටන් විශ්ව විද්‍යාලය (Washington university) දක්වන අදහස් අනුව ප්‍රචණ්ඩත්වය ආලය කරා පැමිණ ඇත්තේ පාලනය කිරීම මතය. එය ප්‍රධාන ලක්ෂණ දෙකක් මත පදනම් වේ.


- ආදරේ දී බලය ලබාගැනීම
- ආදරේදී අනෙකා පාලනය කිරීම

ඉහත කරුණු සලකා බැලීමේදි මෙම ආදරය හා බැඳුණු ප්‍රචණ්ඩත්වය තුළින් එක් පාර්ශවයක් විසින් අනෙකුත් පාර්ශවය පාලනය කිරීම සඳහා බලහත්කාරය භාවිත කිරීම තුළින් විවිධ ගැටලු නිර්මාණය වීම සිදු වන බව පැහැදිලි වේ.එකී බලය භාවිත කිරීම තුලින් ආදරය වෙනුවට බලපෑම් කිරීම හෝ ශාරීරික මානසික පීඩාවලට පත් වීමට වින්දිත පාර්ශවයට සිදුවේ.එහිදි ආදරයේ සැනසීම වෙනුවට ප්‍රචණ්ඩත්වය ක්‍රියාත්මක වීම සිදු වන අතර එය සමාජ ගැටලු රාශියක ආරම්භයට මග පාදනු ලැබේ.

**ආලයෙහි ප්‍රචණ්ඩත්වයේ ස්වරූපය**

ආලය මානවයා ගේ ජීවිතයේ සුන්දරම අත්දැකීමක් නමුත් ආලයෙහි ප්‍රචණ්ඩත්වය එම සුන්දරත්වයම හානි කරවන අත්දැකීමක් බව නොරහසකි. ආලයෙහි ප්‍රචණ්ඩත්වය පිළිබඳව විවිධ නිර්වචන හා අර්ථදැක්වීම් පවතී. ඒවා අනුව ආලයෙහි ප්‍රචණ්ඩත්වයේ ස්වභාවය හඳුනාගත හැකිය.

ආදරය ආරම්භ වන්නේ එකිනෙකා කෙරෙහි ඇති ආකර්ෂණය, පෞරුෂත්වය, විශ්වාසය, වැනි මානසික තත්ත්වයන් මුල් කරගෙනය.නමුත් එකිනෙකා කෙරෙහි ඇතිවන දැඩි හැඟීම් නිසා වෙනත් අයකුට තම සහකරු හෝ සහකාරිය අයිති වේ යන භීතිය පදනම් කරගෙන ඊර්ෂ්‍යාව, අහිමිවීම පිළිබඳ භීතිය වැනි මානසික කම්පන ඇතිවේ. ඒ තුළ සැකය වර්ධනය වන අතර එය ආදරයේ තාර්කික අවසානය ද වේ.තමන් ආදරය කරන කෙනාට නිදහස ලබාදීම වෙනුවට තමා වෙතම රඳවා තබා ගැනීමේ උත්සාහය අනෙක් සහකරුගේ නිදහස සීමා කරයි.මෙම බැඳීම් ඒ බාධකය කඩාගෙන යාම ආරම්භ වූ දා සිට ගැටුම ආරම්භ වන අතර සුළු ගැටුම් වලින් මෙම ප්‍රචණ්ඩත්වය වර්ධනය වීම ආරම්භ වේ. නොසලකා හැරීම, වාග් ප්‍රහාර වලින් ආරම්භ වන මෙම ගැටුම පහරදීම, තුවාල සිදු කිරීම දක්වා වර්ධනය වීම සිදුවේ. එහි ප්‍රතිඵලයක් ලෙස ආදරය වෙනුවට වෛරය ඉස්මතු වීම ද දැකිය හැකිය.ආදරයෙන් ආරම්භ වූ සබඳතා පළුදු වී අවසානයේ දී එකිනෙකා ඝාතනය කිරීම දක්වා මෙම ප්‍රචණ්ඩත්වය ස්වරූපය වර්ධනය වීම දැකිය හැකිය. ආලයෙහි ප්‍රචණ්ඩත්වයට ගොදුරු වන්නේ වින්දිතයා සමග ප්‍රේමණීය හෝ සමීප සම්බන්ධතාවයක සිටින අයෙකු විසින් කරනු ලබන ක්‍රියා නිසා ඇතිවන ප්‍රචණ්ඩත්වයකි. මෙම ප්‍රචණ්ඩත්වයට විවිධ ස්වරූප පවතී. එහි ස්වරූප කීපයක් මෙහි විස්තර කොට ඇත.




*රූපසටහන 5.2. ආලයේ ප්‍රචණ්ඩත්වයේ ස්වරූපයන්.*

**චිත්තවේගීය ප්‍රචණ්ඩත්වය**

මිනිසා ස්වකීය ජීවිතයේ බොහෝ අරමුණු පසුකරගෙන යාමේදී ඒ සමග සුඛ වේදනා හෝ දුක්ඛ වේදනා ආදී මානසිකත්ව ඇතිවෙයි. මෙම මානසිකත්ව චිත්තවේගී යයි සරලවම කියනු ලැබේ.ප්‍රමෝදය හා විශ්වාසය යන චිත්තවේග දෙකෙහි එකතුවක් වශයෙන් ආදරය සැලකිය හැකි ය. (වීරසේකර,2021:1). ප්‍රේමය වූ කලී ප්‍රධාන චිත්තවේගීමය තත්වයකි.එය එසේ නොවන්නේ නම් චිත්තවේගි තත්වයන් දූෂණය විය හැකිය. (Lewis,2017:126). ආලය ප්‍රචණ්ඩත්වයේ තවත් ස්වරූපයක් වන්නේ චිත්තවේගීය වශයෙන් අපහරණයට පත් කිරීම වේ.චිත්තවේගීය ප්‍රචණ්ඩත්වය බොහෝ විට නොසලකා හැරීම, අවමානය කිරීම, තර්ජනය කිරීම, හුදකලා කිරීම සහ පාලනය කිරීම වැනි ක්‍රියාවන්ගෙන් සමන්විත විය හැකිය (Walker,2000:65). මනස සමඟ සිදු කරන ක්‍රියාවන් වැනි චිත්තවේගීය හැසිරීම මගින් අනිත් පාර්ශවය සිතාමතාම පීඩාවට පත් කිරීම මෙහිදී සිදුවේ. ඒ අනුව පහත පරිදි විවිධ ප්‍රචණ්ඩත්වයන් ට චිත්තවේගීය ව පාර්ශවයන් පත්කිරීම සිදුවේ. ඒ සඳහා නිදසුන් කිහිපයක් පහත පරිදි දැක්විය හැකිය

- බොරු හෝ ප්‍රතිවිරෝධතා මගින්
- සහකරු නරක හෝ නරක ලෙස සිතන බව පෙන්වීම
- සිදු කරන ක්‍රියා වල අඩුපාඩු අනිත් අය සමග විවේචනය කිරීම
- ප්‍රතික්ෂේප කිරීම
- දෝෂාරෝපණය
- හැල්ලු කිරීම හා නොසැලකීම
- සිදුවූ අපයෝජන ප්‍රතික්ෂේප කිරීම

- අපවාදාත්මක හැසිරීම සඳහා වගකීම මාරු කිරීම

වැනි කරුණු මඟින් චිත්තවේගීය අන්දමින් ප්‍රචණ්ඩත්වය ප්‍රදර්ශනය වේ.ගැහැණියක් මිනිසා අතහැර යන්නේ ඔහු දෙන දෙයක් ගැන නොසතුටින් නොවේ.ඇය චිත්තවේගීව තෘප්තියට පත් නොවූ හෙයිනි.(චන්ද්‍රවංශ,2008:168).එහිදී බරපතළ ලෙස මානසික පීඩනයන්ට මුහුණ දීමට ආදර සබඳතා තුළ වින්දිතයන්ට සිදුවේ. ශාරීරික ප්‍රචණ්ඩත්වය තරම් පැහැදිලිව නොපෙනුණද, චිත්තවේගීය ප්‍රචණ්ඩත්වය වින්දිතයින්ට දැඩි මානසික හා චිත්තවේගී හානියක් සිදු කළ හැකිය(Herman,1992:77).ප්‍රචණ්ඩත්වයට ගොදුරු වීමෙන් ද තම ජීවිතයේ සැහැල්ලුව අහිමි වන අතර එදිනෙදා ක්‍රියාකාරකම් බිඳවැටී පීඩනයට හා ආතතියට පත් වීම ,කාංසාව,අඩු ආත්මාභිමානය,පශ්චාත් කම්පන ආතති ආබාධ,සියදිවි නසා ගැනීමේ සිතුවිලි ඇති විය හැකි බව හඳුනාගෙන ඇත(Herman,1992:81).තවද දිගු කාලීන වශයෙන් පවතින චිත්තවේගීය ප්‍රචණ්ඩත්වය වින්දිත පාර්ශවයේ සබඳතාවලට,රැකියාව ඇතුලු සමස්ත ජීවන තත්වයට බලපෑම් සිදු කරන බව හඳුනා ගෙන ඇත(Carnes,1999:145).එබැවින් මෙම චිත්තවේගීය ප්‍රචණ්ඩත්වය බරපතළ සමාජ ගැටලුවක් බවට ද පත්වේ.

**ශාරීරික හිංසනය**

සිතුවිලි හා හැඟීම් අක්‍රමවත් වූ විට චර්යාව අක්‍රමවත් වේ. එනම් සිතුවිලි අයහපත් වූ විට පුද්ගලයාගේ හැසිරීම් ද අයහපත් වේ. (පෙරේරා,2020:17). ආලයේ ප්‍රචණ්ඩත්වයේදී ඉතා දරුණු ස්වරූපයක් ලෙස ශාරීරික හිංසනය හඳුනා ගත හැක. උසස් පාසල්වල අධ්‍යාපනය හඳාරනු ලබන සිසුන්ගෙන් සැලකිය යුතු ප්‍රතිශතයක් ආලය සම්බන්ධ ශාරීරික හෝ ලිංගික හිංසනවලට මුහුණ දී ඇති බව එක්සත් ජනපදයේ රෝග පාලන හා වැලැක්වීමේ මධ්‍යස්ථානවල යොවුන් සෞඛ්‍යය අවධානම් හැසිරීම් සමීක්ෂණයට අනුව හඳුනාගෙන තිබේ (Kann et al.,2014:12). සැකය, ක්‍රෝධය වැනි අයහපත් සිතුවිලි හමුවේ මානව ගරුත්වය හෝ එකිනෙකා කෙරෙහි පිළිගැනීමක් නොමැතිව සිදු කරන මෙවන් ශාරීරික හිංසන මානව සමාජයේ දැඩි පිළිකුලට ලක්වන අතර එහි ස්වරූප කිහිපයක් දැක්වේ.

- සහකරුට පහරදීම, තුවාල සිදු කිරීම
- සහකරුගේ ඥාතීන්ට හෝ සුරතල් සතුන්ට ප්‍රචණ්ඩව සැලකීම
- කම්මුල් පහර දීම, පයින් ගැසීම හෝ තල්ලු කිරීම
- සැපීම, සීරීම, හුස්ම හිර කිරීම
- විවිධ වධ බන්ධනයන්ට ලක් කිරීම
- පිලිස්සීම
- විවිධ දඬුවම් ලබාදීම
- කොණ්ඩය කැපීම වැනි ශාරීරික හානි සිදු කිරීම

මෙවන් කෲරත්ව මගින් ප්‍රදර්ශනය වන්නේ අනිත් පාර්ශවය කෙරෙහි ඇති ද්වේශ සහගත සිතිවිලි වේ. ඒ අනුව ආලයේ ප්‍රචණ්ඩත්වයේ ශාරීරික හිංසනය යටතට තල්ලු කිරීම, පහර දීම, ඇදගෙන යාම, ආයුධ භාවිතය වැනි විවිධ ස්වරූප ගන්නා බව හඳුනා ගත හැකි වේ. The National Intimate Partner and Sexual Violence Survey (NISVS) වැනි දත්ත වාර්තා මගින් මෙම හිංසනයේ විවිධ ස්වරූපයන් සහා ඒවායේ සංඛ්‍යාත පිළිබඳව සවිස්තරාත්මක තොරතුරු සපයයි (Smith et al.,2017:12). ආලයේ ප්‍රචණ්ඩත්වයේ ශාරීරික හිංසනයට මුහුණ දීමට සිදුවූ තරුණ තරුණියන්ට ක්ෂණික මෙන්ම දිගු කාලීන බරපතල ප්‍රතිවිපාකවලට මුහුණ දීමට සිදුවූ බව හඳුනාගෙන ඇත (Foshee et al.,2000;1325). තවද ශාරීරික තුවාලවලට අමතරව, මානසික අවපීඩනය, කාංසාව, පශ්චාත් කම්පන ආතති ආබාධ සහ සියදිවි නසාගැනීමේ සිතුවිලි වැනි මානසික සෞඛ්‍ය ගැටලු ඔවුන් අතර බහුලව දක්නට ලැබේ (Basile et al.,2014:8). මෙම අත්දැකීම් ඔවුන්ගේ අනාගත සම්බන්ධතාවලට සහ සමාජීය ජීවිතයට ද අහිතකර ලෙස බලපෑ හැකි බව පර්යේෂණාත්මකව තහවුරු කර ඇත (Exner-Cortens et al.,2013:1708).

**වාචික අපවාදාත්මක හැසිරීම්**

බොහෝ අවස්ථාවලදි ආදරවන්තයන් අතර දැකිය හැකි කරුණක් වනුයේ මතුපිට නොවැදගත් කරුණු සම්බන්ධව වාද විවාද කිරීමයි. කේන්තිය, අසතුට, එපාවීම වැනි අහිතකර මනෝභාවයන් පටල්වා ගනිමින් තම සහකරු පරාජයට පත් කිරීමට උත්සහාදැරීමක් මෙහිදි සිදු වනු ලැබේ (රණසිංහ,2023:73). වාචික අපයෝජනය වශයෙන් අනවශ්‍යය ලෙස කෑ ගැසීම,බැන වැදීම,දෝශාරෝපණය,අසභ්‍යය වශයෙන් කතා කිරීම, තර්ජනාත්මකව කතා කිරීම සහා සමච්චල් කිරීම පෙන්වා දිය හැකිය. 2010 වර්ෂයේදී කොළඹ විශ්ව විද්‍යාලයේ උපාධි අපේක්ෂිකාවන් 283 ක් අතරින් 57.2% දෙනා වාචිකව තම පෙම්වතුන්ගෙන් අපයෝජනයට ලක්වන මිතුරියන් පිළිබඳව දැන සිට ඇත. (United Nations' sexual and reproductive health agency)

ආදරය කරන දෙදෙනා අතර ඇතිවන විරසක වීම් හා අනවබෝධය දුරදිග ගිය විට පළමුව සිදුවන හැසිරීම වන්නේ වාචික අපවාදාත්මක හැසිරීම වේ. මෙම හැසිරීම්වලට පහත කරුණු ඇතුලත් විය හැකිය

- චෝදනා කිරීම හා බොරු චෝදනා වලින් පීඩාවට පත් කිරීම
- සමච්චල් කිරීම
- නොසලකා හැරීම හෝ මඟ හැරීම
- සිතාමතාම සිත් රිදවෙන ආකාරයට කටයුතු කිරීම
- වටිනාකම් ,පිළිගැනීම් වලට හානි වන ආකාරයේ හැසිරීම සිදු කිරීම
- වරදකාරීත්වය පිළිබඳව චෝදනා කිරීම
- තර්ජනය කිරීම හා බිය වැද්දවීම
- ඉක්මන් තීරණ ගැනීමට බල කිරීම

- සම්බන්ධය අවසන් කරන බවට බිය වැද්දවීම
- තම සමීපතමයන්ට හානි කරන බවට තර්ජනය කිරීම
- සියදිවි නසාගන්නා බවට තර්ජනය කිරීම
- නිදහස සීමා කිරීම හා පසු පස හඹා යෑම
- දුරකථන ඇතුළු පෞද්ගලික දෑ පරික්ෂා කිරීම
- රැකියාව ඇතුළු අත්‍යවශ්‍ය දෑ ඉටු කිරීමට බාධා කිරීම
- තම සහකරු අවදානමට පාත්‍ර කිරිම

මෙවන් ප්‍රචණ්ඩත්වයන් ආලයෙහි ප්‍රචණ්ඩත්වයේ මූලික පියවර වේ. මේ තුළින් වින්දිතයා දැඩි මානසික පීඩාවකට පත් වන අතර ඔහුගේ හෝ ඇයගේ එදිනෙදා ජීවන රටා රැකියා තුළ කාර්යයන් බිඳවැටීමට මෙම ප්‍රචණ්ඩත්වයන් ඉවහල් වේ. “The Cycle of Abuse” න්‍යාය මගින් ද පෙන්වා දෙන්නේ වාචික අපයෝජනය ආතතිය ගොඩනැගීමේ අදියරේදී සිදුවිය හැකි අතර, එය අවසානයේ ප්‍රචණ්ඩකාරී පිපිරීමකට මඟ පෑදිය හැකි බවයි (Dutton,1995:68). තවත් අධ්‍යයනයකින් හෙළි වූයේ වාචික අපයෝජනයට ලක් වූ තරුණියන් තම සහකරුවන් කෙරෙහි බියක් සහ පාලනයක් අත්විඳින බවයි (Richie,1996:79). මෙම බිය සහ පාලනය ඔවුන්ගේ නිදහස සීමා කිරීමට සහ ස්වාධීනව තීරණ ගැනීමේ හැකියාවට බාධා කිරීමට හේතු විය හැකිය. එපමණක් නොව, පර්යේෂණ මගින් අවධාරණය කරන්නේ දිගු කාලීනව වාචික අපයෝජනය වින්දිතයින්ට බරපතල මානසික කම්පනයක් ඇති කළ හැකි බවයි (Herman,1992:55). මානසික සෞඛ්‍ය ගැටලු, අඩු ආත්ම අභිමානය සහ සම්බන්ධතාවය පිළිබඳ අතෘප්තිය වැනි අහිතකර ප්‍රතිවිපාකවලට මෙම වාචික අපයෝජනයට නිරාවරණය වන පුද්ගලයින් මුහුණ දිය හැකි බව හඳුනාගෙන ඇත (walker,1979:45). මෙය සමාජීය වශයෙන් බරපතල සමාජ ගැටලු ඇතිකරන තත්වයක් බවට පත්ව ඇත

**ලිංගික හිංසනය**

ලෝක සෞඛ්‍ය සංවිධානය පෙන්වා දෙන පරිදි ලිංගික ප්‍රචණ්ඩත්වය යනු කිසියම් හානිකර හෝ අනවශ්‍ය ලිංගික ක්‍රියාවක් හෝ ප්‍රචණ්ඩත්වය හෝ බලහත්කාරයෙන් ලිංගික ක්‍රියාවක් ලබා ගැනීමට දරන උත්සාහය හෝ වින්දිතයා සමග ඇති සබඳතාව නොසලකා කිසියම් පුද්ගලයෙකු විසින් කැමැත්තෙන් තොරව ඔහුගේ ලිංගිකත්වයට එරෙහිව යොමු කරන ලද ක්‍රියාවක් (WHO,2002:149) 2010 වසරේ කොළඹ විශ්ව විද්‍යාලය තුළ සිදු කරන ලද අද්‍යයනයකට අනුව උපාධි අපේක්ෂිකාවන් 283 ක් අතරින් 60% දෙනා තම පෙම් සබඳතාවය අහිමි වේ යැයි බියෙන් අකමැත්තෙන් වුවත් ලිංගික සබඳතාවලට යොමුවන මිතුරියන් පිළිබඳව දැන සිට ඇත. (United Nations’ sexual and reproductive health agency)

විශේෂයෙන් අකමැත්ත ඇතිව සිදු කරන ලිංගික ක්‍රියා වලින් මෙම ප්‍රචණ්ඩත්වය ප්‍රදර්ශනය වේ.එම ලිංගික ක්‍රියාවලට ප්‍රචණ්ඩව යොදා ගැනීම බරපතළ සමාජ ව්‍යසනයකි. එහි ස්වරූප කිහිපයක් පහත දැක්වේ.

- ලිංගික හැසිරීමට බල කිරීම හෝ තර්ජනය කිරීම
- අන්තර්ජාලය හෝ දුරකථන මගින් නිරුවත් කිරීම
- ලිංගික ක්‍රියාකාරකම් බරපතළ නොවන බවට ප්‍රකාශ කිරීම
- රැවටීමෙන් ලිංගිකව එකතු වීම
- ලිංගික එකතු වන දර්ශන පටිගත කිරීම
- ලිංගික ක්‍රියා අතර ප්‍රචණ්ඩව හැසිරීම

මෙලෙස මානවයෙකු ලෙස උපන් තැනැත්තෙකු ආදරයේ මුවාවෙන් ලිංගිකව හිංසනයට පාත්‍ර කිරීම හා භාවිත කිරීම සමාජයීය වශයෙන් අපරාධමය හැසිරීමත් මෙම තත්ත්වය ආදරය තුළ දී දැකිය හැකි සුලබ සමාජ ගැටලුවක් ලෙස ද දැක්විය හැකිය.

**ආර්ථික ප්‍රචණ්ඩත්වය**

ආදරයේදී යුවලක් තමන් දෙදෙනාම එක් අයෙකු ලෙස සිටීමේ මානසිකත්වයෙන් ඉවත්ව දෙදෙනාටම අවශ්‍ය දේ වෙන් වෙන් වශයෙන් අවශ්‍ය යැයි සිතන මානසික තත්ත්වයකදී (What's yours is mine) ආර්ථික කරුණු අරභයා විශේෂයෙන් ගැටුම් ඇතිකර ගන්නා බව පර්යේෂකයන් දක්වා ඇත.ඇතැම් ප්‍රේමවන්තයන් බැංකු ගිණුම්, මූල්‍ය ලැබීම් ආදිය සියල්ල තමන් වෙත ග්‍රහණය කරගෙන ඒවා පාලනය කරමින් අනෙක් පාර්ශවය පීඩාවට ලක් කිරීම ආලයේ ප්‍රචණ්ඩත්වය තුල දැකිය හැකි ලක්ෂණයකි(sharp,2008:1).ආර්ථිකය වූ කලී පුද්ගල අවශ්‍යතාවලින් ඉහලින්ම පවතින සාධකයකි.ආර්ථික පරිහානිය පුද්ගල ජීවිත පීඩාවට ලක් කරන අතර එකී පීඩනය එක් පසෙකින් තම සමීප සහකරු හෝ සහකාරියගේ මානසික නිදහස සීමා කිරීම කෙරෙහිද බලපෑම් සිදු කල හැකි වේ. ආලයේ ප්‍රචණ්ඩත්වය තවත් රූපයක් වන්නේ ආර්ථිකය පාලනය කිරීමයි. එහිදී පහත අන්දමින් ප්‍රචණ්ඩත්වය දැකිය හැකිය.

- මුදල් ලබාගැනීම හෝ මුදල් ලබාදීම ප්‍රතික්ෂේප කිරීම
- ආර්ථිකය මෙහෙය වීම හා ඒ ගැන නිතර සෙවීම
- කාර්යන්ට හා රැකියාවට බාධා කිරීම
- මුදල් රඳවා ගන්නා ලෙස බල කිරීම
- වැඩ කිරීමට ඉඩ නොදීම
- මෝටර් රථයේ යතුර ගැනීම
- ණය මුදල් විනාශ කිරීම
- නීති විරෝධී ක්‍රියාවලට යොමු කිරීම

මෙවන් ක්‍රම මගින් තම සහකරුගේ ආර්ථික ක්‍රියා පාලනය ආදරය තුළ දැකිය හැකිය. ආර්ථික අස්ථාවරත්වය, රැකියා අහිමිවීම්, සහ මූල්‍යමය දුෂ්කරතා පවුල් තුළ ආතතිය වැඩි කරන ප්‍රධාන සාධක වේ (Pahl,1985). එහි දී පුද්ගලයෙකු ලෙස සංවර්ධනය වීමට ඇති අයිතිය අහිමි වන අතර එය පෞද්ගලික ප්‍රශ්නයක් පමණක්

නොව සමාජයීය ගැටලුවක්ද වේ. එම නිසා ආලෙහි ප්‍රචණ්ඩත්වය පුද්ගලයාට පවුලට මෙන්ම සමාජයට ද බලපායි.

**තාක්ෂණික ප්‍රචණ්ඩත්වය**

තාක්ෂණික ක්‍රම යටතේ ප්‍රචණ්ඩත්වය ක්‍රියාත්මක ක්‍රියාත්මක කිරීම වර්තමානයේ බහුලව දැකිය හැකි සමාජ ගැටලුවකි. වයස අවුරුදු 13ත් 18ත් දක්වා යෞවනයන් 615 යොදා ගනිමින් 2006 වර්ෂයේදී ඇමරිකාවේ සිදු කරන ලද අධ්‍යයනයකට අනුව තරුණ තරුණියන් තාක්ෂණික උපාංග හරහා අපයෝජනයට ගොදුරුවන බවත් ඇතැමුන් අපයෝජකයන් බවත් හඳුනාගත හැකි විය(Janine ,2013:7).කෙටි පණිවිඩ හෝ දුරකථන සංවාද මගින් 25% සහකරු විසින් හිරිහැරයට හෝ පහත් කොට කතා කර ඇති බව වාර්තා විය. 22% ජංගම දුරකථනයෙන් හෝ අන්තර්ජාලය හරහා තමන් අකමැති පරිදි ලිංගික ක්‍රියා සිදුකිරීමට තම සහකරු විසින් ඉල්ලා ඇති බව වාර්තා වී තිබේ. 19% දෙනා තම සහකරු හෝ සහකාරිය පිළිබඳ වැරදි කතා පැතිරවීමට දුරකථනය භාවිත කර ඇති බව හඳුනා ගන්නා ලදි. 18% දෙනා තමන්ට හිරිහැර කිරීමට සමීප සහකරුවන් විසින් සමාජ ජාලා වෙබ් අඩවි භාවිත කර තිබේ.11% දෙනෙකුගේ සහකරුවන් තම සහකරු සමග බෙදා ගත් පෞද්ගලික ඡායාරූප හා වීඩියෝ පට අන් පාර්ශව සමග බෙදාගෙන ඇති බව වාර්තා වී ඇත.17% වාර්තා කරනු ලැබුවේ තම සහකරුගේ දුරකථන ඇමතුම් වලට ප්‍රතිචාර නොදක්වනු ලැබුවහොත් ඔවුන් කුමක් කරයි ද යන බියෙන් පසුවූ බවයි.10% දෙනාට තම සහකරු විසින් දුරකථන ඇමතුම්, ඊමේල්, කෙටි පණිවිඩ හරහා ඔවුන්ගේ සහකරුවන් විසින් තර්ජනය කර ඇති බව තහවුරු වී ඇත(Janine,2013:7). ඒ අනුව තාක්ෂණික ශිල්පීය ක්‍රම ඔස්සේ සබඳතා පවත්වාගෙන යැමේදී ප්‍රචණ්ඩත්වය ක්‍රියාත්මක වන අයුරු පහත පරිදි හඳුනා ගත හැකි වේ.

- සහකරු හෝ සහකාරියට නොදන්වා ඡායාරූප ගැනීම
- විවිධ නීති විරෝධී පටිගත කිරීම්
- තර්ජනය කිරීම්
- නිරුවත් ඡායාරූප හෝ පටිගත දර්ශන බෙදා හැරීම්
- සමාජ මාධ්‍ය ජාලා තුල පීඩාවට පත් කිරීම්

වැනි ප්‍රචණ්ඩ ක්‍රියා තාක්ෂණික මෙවලම් භාවිත කිරීම ඔස්සෙ සිදු කරනු ලැබේ.මෙය ද ආලයේ ප්‍රචණ්ඩත්වය ක්‍රියාත්මක වනු ලබන තවත් එක් ස්වරූපයක් වශයෙන් හඳුනා ගත හැකි ය. තාක්ෂණික මෙවලම් උපයෝගි කර ගනිමින් පවත්වාගෙන යනු ලබන ආදර සබඳතාවල අපයෝජනය ක්‍රියාවන් බහුලව තිබියදීත්, බලපෑමට ලක් වූ යෞවනයන්ගෙන් 9% ක් පමණක් කලාතුරකින් දෙමව්පියන්ගෙන් හෝ ගුරුවරුන්ගෙන් උපකාර ඉල්ලා සිටින බව හඳුනා ගත හැකි විය.(Janine,2013:5)යොවුන් වියේ ආලය ප්‍රචණ්ඩත්වය ආමන්ත්‍රණය කිරීම සඳහා වැඩිහිටියන් ඩිජිටල් සන්නිවේදනය පිළිබඳ සංවාද ආරම්භ කිරීමේ වැදගත්කම අත්‍යවශ්‍ය වේ.

ඉහත සඳහන් කරනු ලබන ආලයේ ප්‍රචණ්ඩ ස්වරූපවලට අමතරව පත සඳහන් කරනු ලබන හැසිරීම් තුලින් ද ආලයේ ප්‍රචණ්ඩත්වය ක්‍රියාත්මක වනු ලැබේ.

**හිරිහැර කිරීම**

ආලය කිරීමේදී ලබා දෙන සුන්දර අත්දැකීම් වලට පරිබාහිරව තමන්ගේ සහකරුට හෝ සහකාරියට බලපෑම් සහගතව හිරිහැර කිරීම ද ආලය ප්‍රචණ්ඩත්වයේ තවත් ස්වරූපයක් වේ.මෙවැනි අවස්ථාවලදි විදිත පාර්ශවය ස්වයංව තමාට හිංසා කර ගැනීමක් හෝ සියදිවි නසා ගැනීම් වැනි තත්වවලට යොමු වීමේ අවස්ථා පවති.එවැනි අවස්ථා හදුනා ගනිමින් ඔහු හෝ ඇය මානසික ප්‍රතිකාර ගැනීම සඳහා යොමු කරවීම වැදගත් වේ. (ඒකනායක,2017:41). ආලයේ නාමයෙන් හිරිහැර සිදු කරමින් ප්‍රචණ්ඩත්වය ක්‍රියාවට නංවීමේ පහත දක්වා ඇති ක්‍රියා උදාහරණ ලෙස පෙන්වා දිය හැකිය.

- අනාරාධිතව හෝ නොදන්වා පැමිණීම
- සහකරුගේ හැසිරීම් විවේචනය කිරීම
- අන් අය ඉදිරියේ සහකරු අනුකරණය කිරීමෙන් අපහසුතාවයට පත් කිරීම
- වෙනත් කෙනෙකු හා සම්බන්ධව ප්‍රශ්න කිරීම හා සම්බන්ධයක් පවතින බවට චෝදනා කිරීමෙන් පිළිබඳව නිරන්තර ප්‍රශ්න ඇති කිරීම
- නිරන්තරයෙන් දුරකතන ඇමතුම් ගැනීම සහ කෙටි පණිවිඩ යැවීම
- සමාජ මාධ්‍ය තුළ සහකරුගේ හැසිරීම සෙවීම
- මානසික නිදහසට හිරිහැර කිරීම
- මිතුරන් ආශ්‍රයෙන් වැලැක්වීම

ආදී ලෙස මෙම හිංසනයන් දැක්විය හැකිය

**හුදෙකලා කිරීම**

ආදරය තමා සමඟ පමණක් පවත්වාගෙන යමින් තම සහකරු හෝ සහකාරිය හුදෙකලා කිරීමට උත්සාහ ගැනීමද ආලෙහි ප්‍රචණ්ඩ ස්වභාවයකි.ඇතැම් අවස්ථාවන්වලදි සමීප සහකරුගේ ප්‍රණ්ඩ හැසිරීම් හේතු කොටගෙන සමාජයට මුහුණ දීමට හෝ සමාජය සමග ගණුදෙනු කිරීමට ඇතිවෙන අකමැත්ත හෝ බිය මුල් කර ගනිමින් සමාජයෙන් සහා තම සමීපතම පුද්ගලයන්ගෙන් ස්වයංව හුදෙකලා වීමට වින්දිත පාර්ශවය පෙලඹීමට හැකිය (ඒකනායක,2017:41). එය සිදුකරන ආකාර කිහිපයක් පවතී.

- මිතුරන් ගෙන් ඈත් කිරීම
- ඥාතීන්ගෙන් ඈත් කිරීම
- කැමති අයෙකු ආශ්‍රය කිරීමට ඉඩ නොදීම
- ආශ්‍රය කරන අය පිළිබඳව සෙවීම හා ඔවුන්ට තර්ජනය කිරීම
- ඥාතීන් සහ මිතුරන් අපහසුතාවයට පත් කිරීම
- යා හැකි තැන් හෝ ආශ්‍රය කළ යුතු අය කවුද යන්න පිළිබඳව දැන්වීම

මෙහිදී දැකිය හැකි තත්ත්වයන් වේ. මෙම තත්ව පුද්ගලයාගෙන් පුද්ගලයාට වෙනස්වීම්වලට ලක් වීම සිදු විය හැකි වේ

**බියගැන්වීම**

ආලයෙහි ප්‍රචණ්ඩත්වයේ තවත් බලපෑම් සහගත ස්වභාවයක් බියගැන්වීම තුළ අන්තර්ගත වේ. එහිදී,

- ක්‍රියාවන් හෝ අභිනයන්ගෙන් බියගැන්වීම
- සබඳතා පිළිබඳ හෙළි කරන බවට බිය වැද්දවීම
- පාලනයෙන් තොරව ක්‍රියා කිරීම
- අනාගත අපේක්ෂා ගැන බිය ගැන්වීම
- සමීපතමයන්ට හෝ රැකියා ස්ථානයට බලපෑම කරන බවට බිය ගැන්වීම
- තමන් මරණයට පත්වීම හෝ සහකරු මරණ බවට බිය ගැන්වීම

මෙවන් තත්ත්ව තුළ වින්දිතයාට මනසික පීඩනය වර්ධනය වීම සිදුවේ.එමගින් ඇතිවන භීතිය නිසා ආතතියට පත්වීම ද එදිනෙදා ක්‍රියාකාරකම් අඩාල වීම ද දැකිය හැකිය.

උක්ත කරුණු සියල්ල මගින් ආලයෙහි ප්‍රචණ්ඩත්වයේ යම් යම් ස්වරූප පැහැදිලි කර ඇත.මෙවන් තත්ත්වයන් ඇතිවීමට මූලික හේතුව වන්නේ ආදරය තේරුම් ගන්නා ආකාරයේ පවතින ගැටලු වේ.තම සමීපතමයා අවිශ්වාස කිරීම, තමන්ට අහිමි වේ යන බිය සහ ඔහුගේ චර්යාවන් පාලනය කොට තමා වෙත පමණක් තබා ගැනීමේ අවශ්‍යතාවය මෙම ගැටළු සඳහා මූලිකව බලපා ඇත.ආලයෙහි ප්‍රචණ්ඩත්වය පුද්ගලයන් දෙදෙනෙකුට පමණක් බලපාන ගැටලුවක් නොවේ. එය සමස්ත සමාජයටම බලපෑම්සහගත ගැටළුවක් වේ.එම නිසා එරෙහි ප්‍රචණ්ඩත්වය සමාජය පවතින බරපතළ සමාජ ගැටලුවක් ලෙස හඳුනාගත හැකි වේ.

**ගෝලීය වශයෙන් ආලයෙහි ප්‍රචණ්ඩත්වයේ ස්වභාවය**

ගෝලීය වශයෙන් ද ආලයේ ප්‍රචණ්ඩත්වය ප්‍රබල සමාජ ගැටලුවක් බවට පත්ව තිබේ.ඒ අනුව පැහැදිලි වන කරුණක් වනුයෙ ආලයෙහි ප්‍රචණ්ඩත්වය එක් ජාතියකට හෝ එක් ආගමකට සීමා නොවන බවයි. එමෙන්ම ආලයේ ප්‍රචණ්ඩත්වය විවාහක පුද්ගලයන් වෙත පමණක් යොමු නොවන අතර එය නව යොවුන්,තරුණ,වැඩිහිටි යන ඕනම වයස් කාණ්ඩයක පුද්ගලයන්ට මුහුණ දීමට සිදු විය හැක(Fisher,2010:263).ආලයෙහි ප්‍රචණ්ඩත්වය හා ඒ හා සම්බන්ධ දත්ත රටින් රටට වෙනස් වේ.ගෝලීය වශයෙන් පවතින ආලයෙහි ප්‍රචණ්ඩත්වයට අදාල දත්ත කිහිපයක් පහත දක්වා තිබෙ. ආලයෙහි ප්‍රචණ්ඩත්වයට අදාළ තොරතුරු විග්‍රහ කිරීමේ දී ඒ පිළිබඳව නිල වශයෙන් ජනතාවට දැනුවත් කිරීම අතින් ඇමරිකාව මූලික ස්ථානයක සිටින බව සංඛ්‍යා ලේඛන වලින් පැහැදිලි වේ.පහත දැක්වෙන තොරතුරු වලින් ආලයෙහි ප්‍රචණ්ඩත්වයේ ස්වභාවය පිළිබඳව පැහැදිලි වේ.

1. ඇමරිකා එක්සත් ජනපදයේ සමීප සහකරු විසින් ශාරීරිකව විනාඩියකට පුද්ගලයන් විසි දෙනෙකු පමණ අපයෝජනයකට ලක් වේ

2. වසරක් තුල මිලියන දහයකට ආසන්න පුද්ගලයන් පිරිසක් සමීප සහකරුගෙන් ශාරීරිකව පීඩාවට පත්වේ

3. කාන්තාවන් හතර දෙනෙකුගෙන් එක් අයෙකු (25%)පමණ සමීප සහකරු නිසා පහත පීඩාවට ලක් වන නිසා එය පිරිමින්ගේ සංඛ්‍යාවට වඩා වෙනස්ය. පිරිමින් නම දෙනෙකුගෙන් එක් අයෙක් (11%) පහත පීඩාවන්ට ලක් වන්නේ ආලයෙහි ප්‍රචණ්ඩත්වය නිසාය.එම පීඩා පහත පරිදිය.

- ශාරීරික හිංසනය
- ලිංගික හිංසනය
- තුවාල බිය
- පශ්චාත් කම්පනය
- ආතතිය
- ලිංගික සංකෝචනය
- සමීප සහකරු පසුපස හඹා යෑම
- ලිංගික රෝග සම්ප්‍රේෂනය
- විවිධ හීතීන් වලට ලක් කිරීම

4. සමීප සහකරුගෙන් සුළු හෝ ශාරීරික ප්‍රහාරයකට ලක් වීම(උදා:-කම්මුල් ප්‍රහාර, තල්ලු කිරීම වැනි) සෑම කාන්තාවන් තුන් දෙනෙකුගෙන් එක් අයෙක් (33%) ද සෑම පිරිමින් හතර දෙනෙකුගෙන් එක් අයෙක් ද (25%) මුහුණ දී ඇත.

5. කාන්තාවන් දහදෙනෙකුගෙන් එක් අයකු(10%) සමීප සහකරු විසින් දූෂණය කර ඇති අතර පිරිමින් පිළිබඳව දත්ත වාර්තා වී නොමැත.

6. කාන්තාවන්ගෙන් 25% පමණ ද පිරිමින්ගෙන් 4%පමණද සමීප සහකරුගෙන් බරපතළ ශාරීරික හිංසනයකට මුහුණ දී ඇති බව වාර්තා වී ඇත. (උදා:-තුවාල කිරීම, පිලිස්සීම, ගෙල සිරකිරීම)

7. කාන්තාවන් හත් දෙනෙකුගෙන් එක් අයෙක් (14%) ද පිරිමින් 18 දෙනකු ගෙන් එක් අයෙක් ද (5%) සමීප සහකරු විසින් පසු පස හඹා යෑම හෝ ලුහුබැඳීම ට ගොදුරු වී ඇති අතර තම සහකරු විසින් තමාට හෝ තම සමීපතමයෙකු ට හානි කරයි හෝ මරණයකට පත් කරනු ඇතැයි යන බියට පත්ව ඇත.

8. ආලයේ ප්‍රචණ්ඩත්වය හා ගෘහස්ථ හිංසනයේ දී සහකරුවෙකු ළඟ තුවක්කුවක් පැවතීම 500% පමණ අවදානම ඉහළ දමන හේතුවක් වී ඇත

9. සමීප සහකරුගේ ප්‍රචණ්ඩත්වය ඇමරිකාවේ සියලුම ප්‍රචණ්ඩකාරී අපරාධවලින් 15% පමණ අගයක් ගනී.

10. ඇමරිකා එක්සත් ජනපදයේ කාන්තාවන් මිලියන 19.3 හා පිරිමින් මිලියන 5.1 පමණ ඔවුන්ගේ ජීවිත කාලය තුළ ලුහුබැඳ යාමට ගොදුරුව ඇති අතර එසේ සිදු කර ඇත්තේ වර්තමාන සහකරු හෝ හිටපු සහකරු විසිනි.

11. ඇමරිකාවේ සියලුම සියදිවි නසා ගැනීම්වලින් 72% කට පමණ හේතුව සමීප සහකරු බව අධ්‍යයනයකින් හඳුනාගෙන ඇත. එයින් 94% පමණ කාන්තාවන් වේ

12. වයස අවුරුදු 18 ට අඩු ළමුන් පහළොවෙන් එකක් ( 7.5%) පමණ සමීප සහකරුගේ ප්‍රචණ්ඩත්වයට ගොදුරු වේ.

13. සමිති සහ ලෝකයේ ප්‍රචණ්ඩත්වය නිසා සෑම වසරකම සේවක මිලියන 8කට පමණ වැටුප් සහිත වැඩ අහිමි වන අතර සහකරුගේ ප්‍රචණ්ඩත්වයේ පිරිවැය වසරකට ඩොලර් බිලියන 8.3 ඉක්මවයි

14. සමීප සහකරුගේ ප්‍රචණ්ඩත්වයට ගොදුරු වූවන් ගෙන් 21% අපයෝජකයන් නිසා ඇතිවන විවිධ හේතු නිසා රැකියා අහිමි වී ඇත.

(https://www.dolanzimmerman.com/domestic-violence-statistics)

උක්ත සංඛ්‍යා ලේඛනවලින් ආදරය කරන සහකරුවෙකු විසින් අනෙක් සහකරුවා වෙත කරන බලපෑමේ ස්වභාවය පැහැදිලි වේ. ගෝලීය මට්ටමෙන් ද ලංකාවේ ද මෙලෙස සිදුවන අතර විස්තරාත්මකව නි වැරදි තොරතුරු ලබා ගැනීම අපහසු වේ. ආලයේ ප්‍රචණ්ඩත්වය යනු සමාජයේ ගැටුම්වල තවත් එක් ස්වභාවයක් වේ. සමාජයේ පුද්ගලයන් අතර ඇතිවන සැකය, වෛරය,තරහ, පලිගැනීම, ගෞරවය අහිමි වීම, නොසැලකීම, පීඩාව,ආර්ථික හානිය, මානසික නිදහස අහිමි වීම වැනි හේතු මෙම ප්‍රචන්ඩ හැසිරීම් ඇති වීමට බලපායි. එබැවින් ලොව පුරාම ආලය හා බැඳුණු ප්‍රචණ්ඩත්වය පවතින බව පැහැදිලිව හඳුනාගත හැකිය.ඒ පිළිබඳව වාර්තා වී ඇති පහත සිදු වීම් ඇසුරින් අවබෝධයක් ලබා ගැනීමට හැකි වනු ඇත.

**ජොනී ඩෙප්-ඇම්බර් නඩු තීන්දුව**

ආලයේ ප්‍රචණ්ඩත්වය පිළිබඳව සාකච්ඡා කිරීමේදී කාන්තා පාර්ශවය වෙත බොහෝ දෙනාගේ වැඩි අවධානය යොමුවනු ලැබුවද පිරිමි පාර්ශවය ද ප්‍රචණ්ඩත්වයට ගොදුරු වීම පිළිබඳව සාකච්ඡාවට බඳුන් වනුයේ අවම වශයෙනි. කාන්තාවන් අතින් තමන්ගේ සැමියාට ද ප්‍රචණ්ඩත්වය යොමු වන අයුරු සුප්‍රසිද්ධ ජොනී ඩෙප්-ඇම්බර් නඩු තීන්දුව තුලින් ලෝකයාට නිරාවරණය වීම සිදුවිය.එහි නිරාවරණය වූ කරුණු අනුව බිරිඳ වූ ඇම්බර් විසින් ජොනී ඩෙප් ව නාන කාමරයේ පැය ගණනාවක් සිරගත කළ බව, ඔහුගේ නිදියහන මත මල පහ කර ඇති බවත්, ඔහුව පහත් කිරීමට තැත් කළ බව යනාදී තොරතුරු රැසක් අනාවරණය වීම සිදුවිය.ඩෙප් විසින් සිය බිරිඳ වූ ඇම්බර්ට පහරදී නැති බවත් ඇම්බර් විසින් ඩෙප්ට පහරදී ඇති බවත් හෙළිදරව් වීම සිදුවිය. ඇම්බර් විසින් ජෝන් ඩෙප් ට ගනු ලැබූ

දුරකථන ඇමතුමක පටිගත කරනු ලැබූ පහත අදහස් අදහස් තුළින් පිරිමියකු වීමේ අවාසනාව පෙන්නුම් කරන බව ජොනි ඩෙප් ප්‍රකාශ කරන ලදී.

"ඔයා පිරිමියෙක් නිසා කිසිම කෙනෙක් ඔයාව විශ්වාස කරන්නේ නෑ. 'මගේ නම ජොනී ඩෙප්. මම සුදු ජාතිකයෙක්.මම ගෘහස්ථ හිංසනයට ගොදුරු වුණා' කියලා බලනවා.කවුරුත්ම ඔයාව විශ්වාස කරන් නෑ"(2022.ජුනි මස 02 දා මව්බිම පුවත් පත ඇසුරිනි).

කෙසේ වෙතත් මාස ගණනාවක් පුරාවට දික් ගැස්සුනු මෙම නඩු තීන්දුවේ අවසන් ප්‍රතිඵලය වූයේ ජොනි ඩෙප් නිවැරදි බවට සනාථ වීමෙන් නඩුව ජයග්‍රහණය කිරීමයි. එකී නඩු තීන්දුවත් සමග ලිංග භේදයකින් තොරව කිසිවෙකු ආලය ප්‍රචණ්ඩත්වයේ ගොදුරක් නොවිය යුතු බව අවධාරණය වීම සිදුවිය.

**ලාංකේය සමාජය තුළ ආලයෙහි ප්‍රචණ්ඩත්වයේ ස්වභාවය**

ලාංකේය සමාජය තුළ ආලයේ ප්‍රචණ්ඩත්වය බහුල වශයෙන් පැවතුනද එම තත්ව පිළිබඳව නිවැරදි තොරතුරු වාර්තා වීම අවම වශයෙන් පැවතීම හේතුවෙන් නිවැරදි දත්ත ලබා ගැනීම පිළිබඳව හිගයක් පවති.සමාජීය බලපෑම්,අපකීර්තියට පත් වීමට ඇති බිය,දැනුවත්භාවයක් නොවීම,නොසලකා හැරීම යන සාධක හමුවේ මෙය ලංකාවේ සැගවුණු සමාජ ගැටලුවක් බවට පත්වෙමින් ඇත.ආලයෙහි ප්‍රචණ්ඩත්වය වර්තමානයේ වැඩි වශයෙන් සමාජය වෙත සමීප කරනුයේ ජනමාධ්‍ය හා සමාජ ජාලා වෙබ් අඩවි තුළිනි.එමෙන්ම සමාජ මාධ්‍ය උපක්‍රම වලින් ද මෙම ප්‍රචණ්ඩත්වයේ ස්වරූපය ප්‍රදර්ශනය වේ. මෙම කලාපයේ ආලයේ ප්‍රචණ්ඩත්වයට අදාළ තොරතුරු විශ්ලේෂණයේ දී පහත කරුණු මූලිකව හඳුනා ගැනීමට හැකිවේ.

1. ආදරය පිළිබඳව සැකය නිසා තම සහකරු හෝ සහකාරිය ඝාතනය කිරීම පිළිබඳ කෲර තොරතුරු

2. ආදරය වෙනත් කෙනෙකුට අයත් වේ යන බිය හෝ තමන් අතහැර දැමීමට සූදානම් වන සැකය නිසා කෲර ලෙස සහකරුව ඝාතනයකොට සැඟවීමට උත්සාහ දැරීම.

3. සහකාරිය සමඟ ප්‍රේමණීය සිටින ලද අවස්ථාවල ලිංගික දර්ශන, නිරුවත් ඡායාරූප සමාජ මාධ්‍ය ජාලා වෙත මුදාහැර කෲරත්වය ප්‍රදර්ශනය කිරීම

4. ආදරය කරන ලද පුද්ගලයාගේ චරිතය හෝ පවුල විනාශ වන ආකාරයේ අපවාද පැතිරවීම හා පලි ගැනීමට උත්සාහ දැරීම.

5. ඇසිඩ් ගැසීම, කුලී ඝාතකයන් ලවා ඝාතනය හෝ ශාරීරික හානි සිදු කිරීමට කටයුතු කිරීම

6. බරපතළ ලිංගික හිංසනයන්ට පැමිණවීම, තුවාල කිරීම, පිළිස්සීම වැනි දරුණු ක්‍රියා වල නිරත වීම.

7. පසු පස ලුහු බැඳීම හෝ හඹා යෑම

8. මිතුරන්ට හෝ සමාජ ජාලා මිතුරන්ට දුරකථනයේ ඇති අංක අනුව කතාකොට චරිතය විනාශ කිරීම හෝ චේතනාන්විතව එවන් ක්‍රියා මගින් සමාජය තුළ අපහසුතාවයට පත් කිරීම.

මෙවන් ක්‍රියා මගින් තම පෙම්වතා හෝ පෙම්වතිය පීඩනයට පත් කිරීමේ සිට කෲර අන්දමින් ඝාතනය කිරීම පිළිබඳ අත්දැකීම් ලංකාව ඇතුළු කලාපීය රටවලින් ද දැකිය හැක.ආලයෙහි ප්‍රචණ්ඩත්වය එක් මානව සම්බන්ධතාවයක් මූලිකවම දෙදෙනෙකුට බලපාන කරුණක් වුවද එහි ප්‍රතිඵල සමාජයටම දර්ශනය වන නිසා සමාජ ගැටලුවක් බවට පත් වේ. ආදරය වූ කලී සුන්දර අත්දැකීමකි. නමුත් ආලය හා වයිරය අතර පවතිනුයේ කෙස් ගහක තරම් පරතරය බව ලාංකීය සමාජය තුල පවතින අදහස් ගොඩ නැගී ඇත්තේ ආලයේ ප්‍රචණ්ඩත්වය හේතුවෙන් ඇති වන දැඩි හානිකර බලපෑම් නිසා විය හැකිය. ආලය හේතුවෙන්ම ඇති වන ප්‍රචණ්ඩත්වයේ අහිතකරම මානසික බලපෑම වන වයිරය හේතුවෙන් අවසානයේ තම සහකරු මරා දැමීම හෝ තමාටම හානි සිදු කර ගැනීම දැකිය හැකි වේ. පසුගිය වසර (2003) තුළ ආලයේ ප්‍රචණ්ඩත්වය හේතුවෙන් සිදු වූ හානි දායක් සිදු වීම් රැසක් වාර්තා වීම සිදු විය. ඒ සම්බන්ධ සිද්ධි කිහිපයක් පහත දක්වා තිබේ.

"ප්‍රේම සම්බන්ධතාවක් මුල්කරගෙන ඇතිවූ ආරවුලක් මත කොළඹ විශ්වවිද්‍යාලයේ විද්‍යාපීඨයේ තුන්වන වසරේ ශිෂ්‍යාවක කොළඹ තුරඟ තරඟ පිටිය අසලදී ඊයේ (2023.01.17 වැනිදා) දහවල් තියුණු ආයුධයකින් ගෙල කපා සාහසික අන්දමින් ඝාතනය කර පලා ගිය පෙම්වතා පොලිසිය මගින් අත්අඩංගුවට ගෙන ඇත. මෙම ශිෂ්‍යාව සිය පෙම්වතා ද සමග කොළඹ තුරඟ තරඟ පිටිය අසල සිමෙන්ති පඩියක වාඩිවී කතා කරමින් සිට ඇත. එහිදී දෙදෙනා අතර ආරවුලක් හටගෙන ඇති අතර පෙම්වතා තියුණු ආයුධයකින් ඇගේ ගෙල කපා ඝාතනය කර පලා ගොස් තිබේ."(දිණමිණ,2023:5)

හේමන්ත රන්දුණු විසින් 2023 ජනවාරි මස 18 වන දින දිනමිණ පුවත් පතට වාර්තා කරන ලද ඉහත සිදු වීම ආලයේ ප්‍රචණ්ඩත්වය පෙන්නුම් කරනු ලබන සිදුවීම් බහුතරයක එක් සිදු වීමක් පමණි. මේ පිළිබඳව විමර්ශන කටයුතු සිදු කරගෙන යෑමේදි අනාවරණය වී ඇත්තේ මිය ගිය තරුණිය ප්‍රේම සබදතාවය නතර කිරීමට කටයුතු කිරීම හේතුවෙන් ඇති වූ බහින් බස් වීමක් දුර දිග යෑමෙන් මෙම ඝාතනය සිදු කර ඇති බවයි. ඒ අනුව ආලයේ ප්‍රචණ්ඩත්වය ශාරීරික හානි සිදු කරමින් අවසන ජීවිත පවා විනාශ වීමට තරම් බලපෑම් සිදු කරනු ලබන බව මෙම සිදු වීම් මගින් තහවුරු වනු ලැබෙ.

පහත සිදුවීම් තුලින් ද වාර්තා වනුයේ ආලයේ ප්‍රචණ්ඩත්වයේ හානිකර තත්වයන් වේ.

"මම මේ කිසිම දෙයකට දුක්වෙන්නේ නැහැ මම එයාට කරපු දේවල් මමයි දන්නේ. මට ආපු කේන්තියට මම මොනවා කළාද දන්නේ නැහැ සර්. ඕකි ජීවත් වෙලා වැඩක් නැහැ සර්. ඕකි මරන්නම ඕනි"

උඟුරුබොක්ක, දම්පහළ මහා විද්‍යාලයේ ආචාර්යවරියකගේ ගෙල කපා ඝාතනය කිරීමෙන් අනතුරුව පොලිස් අත්අඩංගුවට පත් ඇගේ පෙම්වතා සහකාර පොලිස් අධිකාරිවරයා ඇතුළු නිලධාරීන් ඉදිරියේ එසේ පාපෝච්චාරණයක් කළා. සැකකරු සිය පෙම්වතිය මරා ගසක් උඩ නැග ගෙල වැලලාගෙන සියදිවි හානිකර ගැනීමට උත්සාහ දරා ඇති අතර පසුව පොලිස් නිලධාරීන්ගේ ඉල්ලීම මත ඔහු ගසෙන් බැසීමෙන් පසුව අත්අඩංගුවට ගැනුණා." (www.ada.lk)

ඒ අනුව අධික කෝපය,ඉවසීමකින් තොර වීම යන හේතු සාධක නිසාවෙන් තමාට මෙන් ම අනිකුත් පාර්ශවවලටද ශාරීරිකව හානි සිදු කිරීම්,ඝාතනයට ලක් කිරීම් පවා සිදු කිරීම ආලයේ ප්‍රචණ්ඩත්වය මුල් කොටගෙන සිදු කර ඇති බව හඳුනා ගත හැකි විය.

මෙම සිදු වීම් වාර්තා කර කාලයත් සමග සමාජයෙන් වියැකී යාම සිදු වුවත් මෙම සිදු වීම් ආලයේ ප්‍රචණ්ඩත්වය හේතුවෙන් ඇති වන සිදු වීම් බව සමාජයේ දැනුවත් භාවයක් නොවීම බේදජනක තත්වයකි. නව යොවුන් වියේ පසු වන්නන් අතර මෙන්ම තරුණ තරුණියත් අතරත් ආලය ප්‍රචණ්ඩත්වයන් වැඩි වශයෙන් සමාජය තුළ දැකිය හැකි බව හඳුනා ගැනීමට හැකි විය.විශ්ව විද්‍යාල අධ්‍යාපනය හදාරනු ලබන බොහෝ තරුණ තරුණියන් ආලයේ ප්‍රචණ්ඩත්වය හේතුවෙන් පීඩනයට ලක්වන බව දැකිය හැකිය.අවසානයේ අධ්‍යාපන කටයුතු පවා අඩාල කර ගනිමින් ජීවිතයේ සාර්ථකත්වය අහිමි කර ගැනීම්වලට ගොදුරු වීම ද බේදනීය තත්වයකි. ආලයේ ප්‍රචණ්ඩත්වයේ ස්වරූපයන් ඉහත සාකච්ඡාවට බඳුන් කරනු ලැබූ අතර ඒවායේ ප්‍රායෝගික තත්වයන් පිළිබඳව ඉහත සිදු වීම් දෙස අවධානය යොමු කිරීමෙන් හඳුනා ගත හැකි වේ. ලංකාවේ ගෘහස්ත ප්‍රචණ්ඩත්වය වැනි කරුණු පිළිබඳව පුළුල් වශයෙන් සාකච්ඡාවට බඳුන් වුවද මෙලෙස ආලය හේතුවෙන් ඇති වන ප්‍රචණ්ඩත්වය පිළිබඳව කරුණු සමාජයේ පුළුල්ව සාකච්ඡාවට බඳුන් වනුයේ අවම වශයෙනි.මෙම ප්‍රචණ්ඩ ක්‍රියාවලින් මිදීම සඳහා වර්තමානය වන විට විවිධ උපකාරක සේවා හඳුන්වා දීමට ලංකා රජය විසින් කටයුතු කර තිබේ.ඒ යටතේ ශ්‍රී ලංකා නීති ආධාර කොමිසම, ළමා හා කාන්තා කටයුතු අමාත්‍යාංශය, ළමා හා කාන්තා අපයෝජන වැළැක්වීම පිළිබඳ කාර්යාංශය, කාන්තා පිහිට ආයතනය, පොලීසිය වැදගත් මෙහෙයක් ඉටු කරනු ලැබේ. ලංකාව තුළ ආලයේ ප්‍රචණ්ඩත්වය සා සම්බන්ධ වාර්තා වන සිදු වීම් අවම මට්ටමක පැවතුනද ලාංකීය සමාජය තුල ද ආලයේ ප්‍රචණ්ඩත්වය සමකාලීන සමාජ ගැටලුවක් බවට පත්වෙමින් පවතින බව පැහැදිලිව හඳුනා ගත හැකි කරුණක් බවට පත් වෙමින් ඇත.

## සමාලෝචනය

ආලයෙහි ප්‍රචණ්ඩත්වය සමාජ ගැටලුවක් ලෙස කාලීනව අවධානයට ලක් විය යුතු බව පැහැදිලිය.ආලය තුළින් බලාපොරොත්තු වන සුභවාදී අරමුණු වෙනුවට ප්‍රචණ්ඩත්වයේ විනාශකාරී අත්දැකීම් වලට මුහුණ දීම ඛේදවාචකයක් වේ. ආදරය පාලනයට හා බලය ලබා ගැනීමට මෙම ප්‍රචණ්ඩත්වය භාවිත වන අතර වින්දිතයන් මෙන්ම ප්‍රචණ්ඩව හැසිරෙන තැනැත්තාද විඳවීමට හා පීඩනයට ලක්වීම සිදුවේ. පිරිමියා නිතරම තම වැඩ හා ජයග්‍රහණ මගින් තමා කවුදැයි පෙන්වාදීමට කටයුතු කරයි ගැහැණිය තමා කවරේදැයි අර්ථ දක්වනු ලබන්නේ සම්බන්ධතාවයන්හි ගුණාත්මක භාවය මතයි. එහි ප්‍රතිඵලය අනුව ගැහැණිය නොසතුටට පත්වූයේ ඇගේ සබඳතාවය නිසානම් ඇයට සිය වැඩට හිත යොමු කිරීමට නොහැකිය. පිරිමියා නොසතුටට පත් වූයේ සිය වැඩ සම්බන්ධව නම් ඔහුට සබඳතා පිළිබඳව සිතීමට නොහැකිය (චන්ද්‍රවංශ,2008:166).මෙකී තේරුම් නොගැනීම හමුවේ සිතුවිලි තුළ ඇතිවන ඝට්ටනය හේතුවෙන් දෙපාර්ශවයන් අතර 'තමා තේරුම් නොගන්නේය' යන චෝදනාව මත ආලය ප්‍රචණ්ඩත්වය ක්‍රියාත්මක වීම සිදුවිය හැකිය.පීඩාකාරී ලෙස හැසිරෙන සාමාජිකයා පළමුව චිත්තවේගීය පරිහානියට පත්වූ අයකු බව පැහැදිලි වේ.ලොව පුරා ආලයෙහි ප්‍රචණ්ඩත්වය පිළිබඳව තොරතුරු හඳුනා ගත හැකි අතර එකිනෙකට වෙනස් සංඛ්‍යාලේඛන එහිදී දැකිය හැකිය.ආදරය අතරතුර ප්‍රචණ්ඩත්වයට ලක් වී ශාරීරිකව, මානසිකව මෙන්ම ජීවිතයෙන් ද වන්දි ගෙවන බොහෝ දෙනකු පිළිබඳව ද එදිනෙදා මාධ්‍ය තුළින් තොරතුරු වාර්තා වේ.තරුණ මෙන්ම මධ්‍යම වයසේ ද මහලු වයසේ ද ජීවිත විනාශ වීමට ආලයේ ප්‍රචණ්ඩත්වය බලපාන බැවින් එය ලංකාවේ ද ලෝකයේ ද විවිධ සමාජ සන්දර්භ තුළ බරපතළ සමාජ ගැටලුවක් බව නොරහසකි. ආලයේ ප්‍රචණ්ඩත්වය නිසා පුද්ගලයෙකුට ශාරීරික මෙන්ම මානසික වශයෙන්ද සමාජයීය වශයෙන් ද පරිහානියට පත්වීමට සිදුවේ. මෙම තත්වය කාන්තා පාර්ශවයට පමණක් නොව පිරිමි පාර්ශවය සඳහා ද එක සේ බලපානු ලැබුවත් ස්ත්‍රී පුරුෂ සමාජ භාවීය භූමිකා හමුවේ වැඩි වශයෙන් කාන්තා පාර්ශවය පීඩනයට ලක් වීම දැකිය හැකි වේ.එයින් ඇතිවෙන පීඩා නිසා ශාරීරික හා මානසික රෝග වලට ලක්ව අවසානයේ මරණය කරා ළඟා වීම ද සිදුවිය හැකිය.ගෘහස්ත ප්‍රචණ්ඩත්වය වැනි කරුණු පිළිබඳව බහුල වශයෙන් සමාජයේ කතිකාවක් ගොඩ නැගුණද ආලයේ ප්‍රචණ්ඩත්වය පිළිබඳව සමාජය තුළ පුලුල් වශයෙන් සාකච්ඡාවට බඳුන් නොවීම ඛේදනීය තත්වයකි.පසුගිය වසර කිහිපයක් තුල සිදු වූ සිදු වීම් වාර්තා වූ පුවත් දෙස අවධානය යොමු කිරීමේදි ආලයේ ප්‍රචණ්ඩත්වය යනු තව දුරටත් සමාජයෙන් වසන් වී පැවතිය යුතු කරුණක් නොවන බව අවබෝධ කර ගැනීම වැදගත් වේ.ඉහත කරුණු නිරීක්ෂණය කරන විට ආදරයෙන් ජීවිතය පවත්වා ගැනීමට හැකියාවක් පවතින අතර ම ආදරය මානවයන් විනාශයේ දොරටුව වෙත රැගෙන යන බ ද පැහැදිලි වේ. සමාජ ප්‍රශ්නයක් වන ආලෙහි ප්‍රචණ්ඩත්වය අවබෝධ කර ගැනීමත් එයින් ඇතිවන බලපෑම තේරුම් ගැනීමත් සමාජයීය අවශ්‍යතාවයක් වේ.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය

**ද්විතීයික මූලාශ්‍ර**

එදිරිසිංහ, අ. (2007). ගෘහස්ත ප්‍රචණ්ඩත්වය, කොළඹ: සී/ස සදීපා ප්‍රකාශකයෝ

ඒකනායක, අයි. සහා තවත්, (2017). ශ්‍රී ලංකාවේ සම සෙනෙහස්, ද්වි ලිංගික සහා සංක්‍රාන්ති ලිංගික ස්ත්‍රීන් මුහුණ දෙන ගෘහස්ත සහා පවුල් ප්‍රචණ්ඩත්වය ආමන්ත්‍රණය කිරීම, කොළඹ: කාන්තාව සහා මාධ්‍ය සමූහිකය.

චන්ද්‍රවංශ, ආර්. (පරි). (2008). පිරිමින් සහා ගැහැණුන් මෙතරම් වෙනස් ඇයි?, කොළඹ: විජේසූරිය ග්‍රන්ථ කේන්ද්‍රය.

පෙරේරා, එම්. ආර්. එල්. (2020). මනෝ විද්‍යාත්මක උපදේශනය (සංකල්ප, න්‍යාය හා භාවිතය), දකුණු පළාත් සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යයාංශය.

පෝල්, එ. (2008). අඳුරෙන් එලියට, ඊක්වල් ග්‍රවුන්ඩ් පදනම.

බණ්ඩාරනායක, අ. සහා අබේපාල, ආර්. (2012). කෝපය කළමණාකරණය, කොට්ටාව: සාර ප්‍රකාශන.

බාලසූරිය, එස්. (1999). හිංසනයට පත් කාන්තාවට උපදේශනය, මොරටුව: සර්වෝදය කුලගන සංසදය.

රණසිංහ, ආර්. (2023). ආදරය, ලිංගිකත්වය, විවාහය, මොරටුව: ප්‍රමුදිත ප්‍රකාශකයෝ.

වීරසේකර, වයි.(2021). චිත්තවේග සහා ජීවිතය, කොළඹ: ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය.

කුමුදු ජයවර්ධන. 2022 ජුනි. මව්බිම, "හිටපු බිරිඳට එරෙහි නඩුවෙන් සුපිරි හොලිවුඩ් නළු ජොනි ඩෙප් ජය ගනී; ඩොලර් මිලියන 15 ක වන්දියක්" කොළඹ: සිලෝන් නිවුස් පේපර් පුද්ගලික සමාගම.

සුගත් නුවන්. 2023 ජනවාරි. දිවයින, "කොළඹ තුරඟ තරග පිටියේදී සරසවි සිසුවියගේ ගෙල සිඳී" කොළඹ: ලේක් හවුස් ප්‍රකාශකයො.

Basile, K. C., Breiding, M. J., Smith, S. G., & Black, M. C. (2014). Prevalence and characteristics of sexual violence, stalking, and intimate partner violence victimization National Intimate Partner and Sexual Violence Survey, United States, 2011. Morbidity and Mortality Weekly Report.

Bandura, A. (1977). Social learning theory. Prentice Hall.

Dobash, R.(1979). Violence against wives: A case against the patriarchy,New York: Free Press.

Dutton, D. G. (1995). The domestic abuse survival guide: Empowering yourself to leave and heal. Simon & Schuster.

Fisher, S. B and Lab, P. S. (2010). Encyclopedia of Victimology And Crime Prevention,Califonia:SAGE Publication.

Foshee, V. A., Bauman, K. E., Greene, W. F., Linder, G. F., & Mac Dougall, J. E. (2000). The long-term effects of adolescent dating violence on delinquency and violence in young adulthood.

Finkelhor, D., Turner, H. A., Shattuck, A., & Hamby, S. L. (2007). Polyvictimization: Children's exposure to multiple forms of violence, crime, and abuse. Pediatrics,

Herman, J. L. (1992). Trauma and recovery. BasicBooks.

Richie, B. E. (1996). Compelled to crime: The gender entrapment of battered Black women. Routledge.

Janine .(2013) "Technology,teen dating violence and abuse and bulling",Washington:Justice Policy Center .

Katharine,D.K.( 2006). Violence in Dating Relationships,Canada:authority of the Minister of Health.

Lewis, C. S. (2017). The Four Loves. San Francisco: HarperOne.

Lewis,C.S, Williasa,F.(2001).Dating Violence: " A Critical review of the literature," Clinical Psychology Review,Volume21.Canada.

Merton, R. K. (1938). Social structure and anomie. American sociological review.

Priyadarshani, I.(1998).Domestic Violence,Colombo:Women Educational Research Center.

Sharp,N.(2008). "Whats's yours is mine" Refuge.

Stark, E.(2007). Coercive control: How men entrap women in personal life. Oxford University Press.

Smith, S. G., Basile, K. C., Breiding, M. J., Black, M. C., & Walters, M. L. (2017). National Intimate Partner and Sexual Violence Survey: 2010-2012 State Report. Centers for Disease Control and Prevention, National Center for Injury Prevention and Control.

Sutherland, E. H., & Cressey, D. R. (1992). Criminology. Lippincott.

Silverman, J. G., Mucci, S. C., & Raj, A. (2001). Dating violence against adolescent girls and associated substance use, unhealthy weight control behaviors, depression, suicidal ideation, and school-based victimization. JAMA.

Walker, L. E. A. (2000). The battered woman syndrome (2nd ed.). Springer

World Health Organization. (2002). World report on violence and health. Geneva: World Health Organization.

**අන්තර්ජාල මූලාශ්‍ර**

www.Cadv.org.)Search on 08.07.202(4

www.wustl.edu.com (Search on 07.08.202(4

Justice.gov.Com (Search on 10.0.7202(4

www.ncadv.org. (Search on 10.07.2024)

https://www.ada.lk (Search on 10.07.2024)

https://srilanka.unfpa.org (Search on 12.07.2024)

https://positivepsychology.com/emotion-wheel) Search on 12.07.2024)

https://www.dolanzimmerman.com/domestic-violence-statistics (Search on 12.07.2024)